Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

# ගැටුම් ව්‍යාවර්තනය සහ සාධාරණ සාමයක් කරා

කෙවින් ක්ලෙමින්ට්ස් (Kevin Clements)

www.berghof-handbook.net




1. හැඳින්වීම 564

2. ස්ථාවර සාමය 565

  දේශපාලනිකභාවයේ කේන්ද්‍රීයත්වය සහ අධිපතනය 566

  සැබෑ දේශපාලනය පිළිබඳ තත්ව පරීක්ෂාව 567

  ප්‍රචණ්ඩත්වයේ දේශපාලනික මූලාශ්‍ර 568

  දේශපාලනය අපරාධීකරණය (සාපරාධිවීම) 569

  කලාපීය දේශපාලන බලපෑම් 572

  ආර්ථිකමය උත්තේජනයන් හට පෙළඹවීමක් ලෙස 573

3. ව්‍යාවර්තනය වෙමින් පවතින ප්‍රචණ්ඩ ගැටුම් තුළ සාමය
  ගොඩනගන්නන්ගේ භූමිකාව සහ සාධාරණ සාම ප්‍රවර්ධනය 578

4. උපක්‍රමයන් 585

5. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියැවීම් 588


©2006 Berghof Research Center for Constructive Conflict **Management**

# ගැටුම් ව්‍යාවර්තනය සහ සාධාරණ සාමයක් කරා

කෙවින් ක්ලෙමන්ට්ස් (Kevin Clements)

## 1. හැඳින්වීම

සාමය, සාධාරණත්වය, සත්‍යය සහ දයාව බොහෝ මනෝරාජ්‍ය (utopian) සහ ආගමික දර්ශනවල කේන්ද්‍රය වේ. උදාහරණ වශයෙන් ස්වර්ගය සහ නිර්වාණය යන සංකල්ප දෙකෙහිම සාධාරණත්වය, අවිරෝධය, අවිහිංසාව සහ ඒකත්වය යන ප්‍රබල අර්ථ දක්නට ඇත. මෙම සංකල්ප බොහෝ සංස්කෘතීන් හා ජන සමාජයන්හි වෙසෙන බොහෝ පුද්ගලයන් මුහුණ දෙන ප්‍රකෘතිය සහ විකෘතිය, සාමය හා යුද්ධය, විරෝධය සහ අවිරෝධය, ව්‍යුහාත්මක ස්ථාවරබව හා අස්ථාවර බව, සමානාත්මතාව සහ විෂමතාව, ඇතුළත් බව සහ පිටස්තර බව, සාධාරණත්වය, අසාධාරණත්වය, ඉවසීම සහ නොඉවසීම හෝ පොහොසත්කම සහ දුප්පත්කම අතර හැකි සෑම අවස්ථාවකදීම යුගලවල පළමුවැන්න තෝරාගනු ඇත. මෙය බෙහෙවින් සාධාරණය. උදාහරණ වශයෙන් ස්ටෙෆන් ජේ. ගුල්ඩ් (2001) ප්‍රකාශ කරන්නේ:

> *දහසක් මිනිසුන් අතර, ඇත්තේ යහපත් හා කරුණාවන්ත නොවන එක් මිනිසෙකි. මානව ඉතිහාසයේ ඛේදනීයත්වය රඳා පවතින්නේ පාපතරයන්ගේ ප්‍රමාණය මත නොව අහඹු පාපතර ක්‍රියා මත ය. විනාශයට අවශ්‍ය වන්නේ එක් ක්ෂණයක් වුවද සංකීර්ණතා පද්ධති ගොඩනැඟිය හැක්කේ පියවරෙන් පියවර බැගිනි. 'මහා අසමතුලිතතාව' යැයි මා හැඳින්වීමට කැමැති අතිවිශාල බහුතරයකගේ 'සාමාන්‍ය' වැයම් ලෙස අදෘශ්‍යමානව හෝ අවධානයට ලක් නොවී පවතින සෑම බලවත් පාපතර ක්‍රියාවක් ම කරුණාවන්ත ක්‍රියා දස දහසකින් තුලනය වේ.*



එහෙයින් කරුණාවන්ත භාවය, පරාර්ථකාමය, සාධාරණත්වය සහ අනුග්‍රාහකත්වය වැනි සංකල්ප යුක්තිය, සාමය සහ ගැටුම් සංවේදී සංවර්ධනය වැනි ශක්තිමත් දේශපාලනික වගකීම් බවට පරිවර්තනය කරන්නේ කෙසේද යන්න බරපතළ ගැටලුවකි. විශ්වීය ආවේගයන් ලෙස පෙනෙන මේවා දේශපාලන භාවිතයේදී සාක්ෂාත් කර ගැනීමට මෙතරම් අපහසු වන්නේ ඇයි?

ප්‍රචණ්ඩ ගැටුම් හා විශ්වමය පරස්පර සම්බන්ධයක් යෝජනා කිරීමට ප්‍රමාණවත් විධිමත් බවකින් යුතුව පවතින ඇතැම් කාරණා ඇති අතර, ඊට වඩා සුවිශේෂී වන වෙනත් කාරණා ඇත (උදාහරණයක් වශයෙන් කණ්ඩායම් අතර විෂමතා සහ කලකිරීම් ප්‍රචණ්ඩකාරී අවසානයන් දක්වා ඒකරාශී කිරීම හෝ ඒවා කුළුගැන්වීම). සංකල්පනාත්මක අභියෝගය වන්නේ සංස්කෘතික විශේෂාංග පිළිබඳව සංවේදී වන අතර ම, ගැටුමක් විය හැකි හෝ සත්‍ය වශයෙන් ම ගැටුමක් පවතින වාතාවරණයක සමස්ත අවදානම් කාරණා මොනවාද යන්න හඳුනා ගැනීම යි.

නෆ්සිගර්, ස්ටුවර්ට් සහ වෙරිනන් (2000, වෙළුම 2) *යුද්ධය, කුසගින්න සහ අවතැන්වීම* නම් ග්‍රන්ථයෙන් මෙම විවිධ ගති ලක්ෂණවල අන්තර්-පරායත්ත ස්වභාවය තහවුරු කිරීමේ දී මෙසේ පවසති.

*ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික මූලයන් (CHE හෙවත්) සංකීර්ණ මානව අවදානම් අවස්ථා), එකිනෙක හා එකට බැඳී පවතී; ජන කොට්ඨාස අතර (සිරස් අසමානතා) සහ තනි පුද්ගලයන් (තිරස් අසමානතා) අතර විශාල ලෙස ඇති අසමානකම්, එනම් නායකයන් බලය සඳහා ඔවුන්ගේ අරගලයට සහාය ලබාගනු පිණිස පුද්ගලයන් ඒකාරාශී කිරීමෙන් ඇතිවන දේශපාලන අසහනය ආදිය එක්වීමෙන් ආර්ථිකය එකතැන පල්වීම හෝ බිඳවැටීම සිදුවන අතර, මින් සංස්කෘතික විෂමතා ගැඹුරු වේ. කණ්ඩායම්වල පවතින ජන වර්ගය, ජාතිය, ආගම, කුලය හෝ පංතිය මත පදනම් වූ විෂමතා ගැටුම් මගින් බලාත්මක වීම හෝ ඇතැම්විට නිර්මාණය වීම සිදු වේ. මෙම වෙනස්කම් මූලික හේතුව නොවුව ද, ඒවා සාමය ගොඩනැංවීම අසීරු කරන ස්වාධීන බලවේගයක් වෙයි. තවද, යුද්ධයේ දී තනි පුද්ගල තීරණවල ප්‍රතිවිපාකය වනුයේ සාමූහික ක්‍රියාදාමයකි. තනි පුද්ගලයන්ගේ දේශපාලනික සහ ආර්ථික අභිප්‍රායයන් යුද්ධය විසින් සපුරාලිය හැකිය. එවැනි පෙළඹවීම් ඇතැම්විට ගැටුමක හේතුව ද විය හැකිය.*

එවන් පරිමාණයන් නොසලකා හැර, සිවිල් සමාජ පරිමාව ඉහළ නැංවීම, ආකල්පමය වෙනස්කම් ඇති කිරීම, සම්බන්ධතාවන් සහ විශ්වාසය ගොඩනැංවීම වැනි මැදිහත්වීමේ ක්‍රියාවලීන් කරා යොමුවීම ජන කොට්ඨාස තුළ සබඳතා වර්ධනය කිරීමේ දී ප්‍රයෝජනවත් විය හැකි නමුත්, පාදක වශයෙන් ඇති ඍජු හෝ ව්‍යුහමය ප්‍රචණ්ඩත්වය මත ස්ථිර බලපෑමක් ඇති කළ නොහැකිය. පාදක ක්‍රියාවලි බෙහෙවින් ව්‍යවසනකාරීව තිබියදී ඒ වෙනුවට, මෙම ජන සමූහ මත පදනම් වූ ක්‍රියාවලීන්, සාමකාමී සබඳතා පිළිබඳ ව්‍යාජ හැඟීමක් උත්පාදනය කරනු ඇත.



එම නිසා මෙම පරිච්ඡේදය කරුණු දෙකක් ඉටු කිරීමේ උත්සාහයකි: පළමුවැන්න, සංවිධානාත්මක ප්‍රචණ්ඩත්වයේ ආර්ථික, දේශපාලනික සහ සමාජයීය මූලයන් සහ ගතිලක්ෂණ හඳුනා ගැනීමයි; දෙවැන්න, ප්‍රචණ්ඩ ගැටුම් පිළිබඳ සැලකිලිමත් වන විවිධ ක්‍රියාකාරීන් විසින් නිල සහ නිල නොවන මට්ටම්වල දී ආකල්ප, හැසිරීම් මෙන්ම ව්‍යුහාත්මක (වක්‍ර) සහ ඍජු ප්‍රචණ්ඩත්වය උත්පාදනය කරන ආයතන වෙනස් කිරීම සඳහා ගැටුම් විශ්ලේෂණය සහ ගැටුම් නිරාකරණ ක්‍රියාවලීන් භාවිත කරගත යුතු අයුරු නිශ්චය කිරීමයි. එය ස්ථාවර සාමයක් සඳහා ව්‍යුහාත්මක ව්‍යාවර්තනයේ කේන්ද්‍රීය වැදගත්කම තහවුරු කිරීමෙන් සහ නූතන ගැටුමකට සහාය සලසන සැඟවුණු දේශපාලනික සහ ආර්ථික ගතිකයන් පිළිබඳ විශ්ලේෂණයක් සමග ආරම්භ වනු ඇත. ඉන්පසුව, එය ගැටුම් නිරාකරණ ක්‍රියාකාරීන්, ගැටුම් සඳහා මැදිහත්වීමේ ක්‍රියාවලි විශ්ලේෂණය කිරීමේ දී, සැලසුම් කිරීමේ දී හා ආරම්භ කිරීමේ දී දේශපාලන ආර්ථිකය පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කළ යුත්තේ මන්දැයි විමර්ශනය කරයි.

## 2. ස්ථාවර සාමය

ස්ථාවර සාමය ලෙස හඳුන්වනු ලබන කාලය පුරාම පවතින අවිහිංසාවාදී සහයෝගීතා සම්බන්ධතා පවතින ප්‍රචණ්ඩතා, ආතතීන්, ප්‍රතිවිරුද්ධතා, අර්බුද ආදියට පිළියම් යෙදීමෙන් ළඟා කරගත නොහැකිය. ඒ සඳහා ගැටුමේ සැඟවුණු මූලයන් පිළිබඳ (මැදිහත්වන්නන් සහ මැදිහත්වූවන් මෙන්ම ගැටුම පිළිබඳව සැබෑ උනන්දුවක් ඇති සියලු දෙනා) වඩා ගැඹුරු සහ සහභාගික විශ්ලේෂණයක අවශ්‍යතාවක් පවතී. මෙම විශ්ලේෂණයේදී කලාපීය මෙන්ම ගෝලීය සංවිධාන සමග ද සුසංයෝග වීම, විශේෂයෙන්ම (සාමය සහ මිනිස් ආරක්ෂාව සඳහා වගකිව යුතු) පුරවැසියන්ගේ අනාරක්ෂිත බවට

සහ මානුෂික අර්බුදවලට ප්‍රධාන මූලයක් වනුයේ ජාතික රාජ්‍ය පද්ධතිය බවට කිසියම් හැඟවීමක් පවතින විටක, ඉතා වැදගත් වේ.

මෙම විශ්ලේෂණය ඇරඹිය යුත්තේ සහාය හෝ මැදිහත් වීමේ ක්‍රියාවලින් සැලසුම් කිරීමට හෝ වර්ධනය කිරීමට පෙරය. මෙය සැඟවුණු ප්‍රශ්න කෙරෙහි රැඩිකල් ස්වභාවයක් මත, ඔවුන්ගේ මූලයන් පිළිබඳව ඓතිහාසික දැනුමක් මත සහ ආයතනික බාධා කිරීම් අවහිරතා හෝ ස්ථාවර සාමකාමී සම්බන්ධතා යථාර්ථයක් බවට පත්වීම වළක්වන සියලු දෑ පිළිබඳව ඉලක්ක ගත විය යුතුය. ඉන් පසුව ඇතිවන ඕනෑම මැදිහත් වීමක් ඵලදායී වීමට මෙම මූලික විශ්ලේෂණය, සාමය ගොඩනගන්නන්ට සහ ගැටුම් නිරාකරණයට සම්බන්ධ අන්‍යයන්ට ද ඉතා තීරණාත්මක වන අතර, මැදිහත් නොවී සිටීමට තීරණය කිරීමේ දී හෝ ගැටලුවලට සැඟවුණු මූලයන් සෙවීමේ ක්‍රියාවලියේ දී මැදිහත් වීමේ වර්ධනය වඩා දේශපාලනික බැව් පෙනී යන විට ද මෙ මගින් ප්‍රතිඵල අත්කර දෙනු ඇත.

### 2.1 දේශපාලනිකභාවයේ කේන්ද්‍රීයත්වය සහ ආධිපත්‍යය

සාමය සහ ප්‍රබල සහභාගීත්ව පාලනයක් ජනනය කරන්නා වූ ආයතන, යාන්ත්‍රණ සහ ක්‍රියාවලීන් පිළිබඳව අවධානය යොමු නොකොට, ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය සහ සමාජ- ආර්ථික අසාධාරණය පිළිබඳ ව ගැඹුරු ප්‍රශ්නවලට විසඳුම් සෙවීම ඉතා අසීරුය. උදාහරණ ලෙස, කලේවි හොල්ස්ටි (1996, 20-21) ප්‍රකාශ කරන්නේ,

*විසිවන සියවසේ අග භාගයේ යුද්ධ ඇති වී ඇත්තේ විදේශ ප්‍රතිපත්ති, ආරක්ෂාව, ගෞරවය හෝ තත්ත්වය පිළිබඳව නොවේ; ඒවා රාජ්‍යයත්වය, පාලනය සහ ජාතීන්ගේ සහ ජනකොටස්වල භූමිකා සහ තරාතිරම් පිළිබඳවය.*



ස්වාධිපත්‍යයැයි කියාගන්නා බොහෝ රාජ්‍යයන් සහ ආණ්ඩුවල බලාත්මක ශක්‍යතා ඒකාධිකාරය ප්‍රමාණවත් නොවීම සහ ඔවුන්ගේ පාලන ප්‍රදේශවල නීතිය ස්ථාපිත කිරීමට නොහැකියාව පිළිබඳ වඩ වඩාත් සාක්ෂි ලෝකයේ යුද කලාපවලින් ලැබෙමින් පවතී. මිනිසුන් (රටවැසියන්) වෙනුවෙන් සහ ඔවුන් සඳහා වූ පාලනයකින් ඈත් වී ඇති ඔවුන්ට, එක්කෝ වැසියන් කරා නීත්‍යානුකූල අධිකාරය පතුරුවාලීමට සහ ආරක්ෂාව ලබාදීමට නොහැකිය; නැතිනම් ඔවුහු දැඩි ලෙස කොල්ලකාරී හෝ සූරාකෑමෙහි යෙදෙන පිරිසකි. ජාත්‍යන්තර නීතිය මෙම රාජ්‍යයන්ට සමානාත්මතාවය ප්‍රදානය කළ ද, එක් රාජ්‍ය ස්වාධිපත්‍යයේ සහ මානව ආරක්ෂාවේ ඵල සිය වැසියන්ට ප්‍රදානය කිරීමේ මූලික අවශ්‍යතා සපුරා නැත.

මෙම ඌන-ස්වාධිපත්‍යභාවය සහිත රාජ්‍ය හා සම්බන්ධ ගැටුම් නිරාකරණ ක්‍රියාකාරීහුත් සේවකයෝත් බරපතළ උභතෝකෝටියකට මුහුණ දී සිටිති. අසාර්ථක වූ හෝ අසාර්ථක වෙමින් පවත්නා රාජ්‍ය පද්ධති ඔවුන් එකඟ වූ සම්මුතීන් ඉදිරිපත් කිරීමට නොහැකිව සිටින අවස්ථාවක නිල හා නිල නොවන ක්‍රියාකාරීන් එසේ කළ හැකියයි සිතුවහොත් එසේ ඉදිරිපත් කිරීමෙන් සාකච්ඡා ක්‍රියාවලිය ආරම්භයේදී ම ව්‍යර්ථ වනු ඇත. එහි ප්‍රතිවිරුද්ධ උපකල්පනය එනම්, දූෂිත, දුර්වල, අසම්පූර්ණ රාජ්‍යයන් සමඟ සාකච්ඡා කිරීම නිෂ්ඵල කාර්යයක් ලෙස සලකන්නේ නම්, ප්‍රචණ්ඩ ගැටලුවලට සාකච්ඡාමය විසඳුමක් නැත. දේශපාලනමය හැකියාව පිළිබඳ අවකාශය ඇත්තේ කුහක බව සහ නොහැකියාව යන අන්තරායන් දෙක අතර තැනකය.

සියලු ගැටුම් නිරාකරණ ක්‍රියාකාරීන් (නිල හෝ නිල නොලත්) මුහුණපාන විශාලතම ගැටලුව වන්නේ රාජ්‍යයක් කෙබඳු ආකාරයේ ද යන්න හඳුනා ගැනීම සහ මැදිහත්වීම් මගින් මිනිසුන් අතර ස්ථිර සබඳතාවක් ඇති කිරීමට හැකිවේ ද, නොවේ ද යන්නයි.

එක්කෝ රාජ්‍ය පද්ධතීන් ඇති කරන්නා වූ හෝ නැතහොත් විසඳීමට අකමැති හෝ අසමත් ප්‍රශ්න හා කටයුතු කිරීමට සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට සහාය වීමේ සූදානමක් රාජ්‍ය නොවන සංවිධාන පාර්ශවයෙන් තිබේ. මින් ඇතැම් විට සිදුවන්නේ රාජ්‍ය පද්ධතියේ මූලික අංශවලට වඩා සංවිධානාත්මක සහ වෘත්තියමය ශක්‍යතාවක් ඇති ඇතැම් කොටස් සිවිල් සමාජය තුළ බිහිවීමයි. උදාහරණයක් ලෙස බුරුන්ඩිහි මානව හිමිකම් අමාත්‍යාංශයට ඇත්තේ එරට බොහෝ රාජ්‍ය නොවන සංවිධානවල ඇති සම්පත්වලට වඩා අඩු සම්පත් ප්‍රමාණයකි.

මෙම අසමතුලිතතාව උග්‍ර ගැටලු දෙකක් මතු කරයි. පළමු වැන්න නම් සිවිල් සමාජය, සිය අයිතීන් සම්බන්ධයෙන් රාජ්‍යයට මුහුණට මුහුණ ලා ප්‍රකාශ කරන්නේ කෙසේද යන්න වන අතර, දෙවැන්න නම් අකාර්යක්ෂම, ප්‍රබල පාලනයක් ගෙන යා නොහැකි දූෂිත රාජ්‍ය වාතාවරණයක් තුළ මෙය ඵලදායී වේ ද, නොවේද, යන්නයි. දෙවැනි ගැටලුව ආණ්ඩු සහ අන්තර් ආණ්ඩු ක්‍රියාකාරීන් අභිමුවේ පවතී. නිල හා නිල නොවන මැදිහත්වන්නන් ගනුදෙනු කරන්නේ ප්‍රබල පාලන හැකියාවක් නොමැති අසාර්ථක වූ හෝ අසාර්ථක වෙමින් පවතින කොල්ලකාරී රාජ්‍ය පද්ධති සමග නම්, පිටුවහල් කරනු ලැබූ හෝ සූරාකෑමට ලක් වූ වැසියන් තුළ දුර්මත ජනනය කිරීමට එය සමත්වනු ඇත. මෙහි ප්‍රතිඵලය වනු ඇත්තේ අවිශ්වාසය පදනම් වූ කටයුතු, සාකච්ඡා සහ අභව්‍ය සම්මුතීන් ඇතිවීම යි. අනුමාන වශයෙන් සලකන අධිකාරියක් හා ගනුදෙනු නොකිරීම යන්නෙන් අදහස් කරන්නේ සාකච්ඡා නැත යන්න යි. මේ නිසා ආණ්ඩු හෝ සිවිල් සමාජ මට්ටමින් හෝ ප්‍රචණ්ඩ ගැටුම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී නිරතුරුව ම විසඳුම් තරම් ම ගැටලු ද හට ගනී. 

## 2.2 සැබෑ දේශපාලනය පිළිබඳ තත්ව-පරීක්ෂාව

දේශපාලන යථාර්ථයට සහ සැබෑ දේශපාලනයට විකල්පයක් හෝ තත්ව-පරීක්ෂාවක් ලෙස, ගැටුම් නිරාකරණ ක්ෂේත්‍රය යම්තාක් දුරට දියුණු වී ඇත. බලය, විශාල උත්තේජකයක් වුවත් බොහෝ පුද්ගලයන්ට එය මූලික නොවන බවට ගැටුම් විශ්ලේෂකයෝ සහතික වෙති. අනික් අතට, සහයෝගී සබඳතා මෙන් ම අනන්‍යතාවය, ආරක්ෂාව සහ දේපළ සහ සුබ සාධන යන අවශ්‍යතාවන් තෘප්තිමත් කිරීම සඳහා කැමැත්ත මානව උත්තේජනයේ වැදගත් ප්‍රභවයක් වේ.

එහෙයින් ගැටුම් නිරාකරණ ක්‍රියාකාරීන් සෑමවිට ම රාජ්‍ය සහ දේශපාලන පද්ධතිය දෙසට නැඹුරුවීමේ ප්‍රවණතාවක් පවතී. අනෙක් අතට රාජ්‍යයේ වැදගත් බව තහවුරු කිරීමට කැමැත්තක් පවතිද්දී අනෙක් අතින් බලයේ රාජ්‍ය ඒකාධිකාරය පිළිබඳ තත්ත්ව පරික්ෂාවක් මෙන්ම නීතියේ හා ස්ථාවරත්වයේ මූලිකාංග ජනනය කිරීම වැළැක්වීමේ උත්සාහයක් ද පවතී. මේ හේතුව නිසා බොහෝ ගැටුම් නිරාකරණ ක්‍රියාකාරීන් තුළ, සිවිල් සමාජයීය කණ්ඩායම් සමග සේවය කිරීමෙන් දේශපාලනික හැසිරීම් නවීකරණය කිරීමට දැඩි කැමැත්තක් ඇත.

මෙම පරිච්ඡේදයේ ප්‍රධානතම තර්කයන්ගෙන් එකක් වනුයේ රජයේ පාර්ශ්වයෙන් ප්‍රචණ්ඩ ගැටුම් උත්පාදනය කරන ආකාරය සහ ඇතැම්විට ඒවා වර්ධනය කරන ආකාරය පිළිබඳව විශේෂිත විශ්ලේෂණයක් කිරීමට වැඩි කාලයක් යෙදවිය හැකි ගැටුම් විශේෂඥතාවයන්ගේ අවශ්‍යතාවයි. මෙය සිදු නොවී නම් සහ ගැටුම් සංවේදී දේශපාලනයේ සංවර්ධනයක් ඇති නොවන අතර (සාමය හා ගැටුම් බලපෑම් තක්සේරු ක්‍රමවේදය ගැටුම් සංවේදී සංවර්ධනයට දායක වී ඇති ආකාරයට) එවිට සැබෑ දේශපාලනය යොදාගෙන දේශපාලන න්‍යාය පත්‍රය සැකසීම දිගට ම සිදුවනු ඇත. මෙය ලෙහෙසි පහසු කාර්යයක් නොවේ (ත්‍රස්තවාදයට එරෙහිව දූන් පැන නැගි යුද්ධය අභිමුවේ විඥානවාදී දේශපාලනමය චින්තකයන් පසුබැසීම දෙස බලන්න). එහෙත්, යුද්ධය හා ප්‍රචණ්ඩත්වය අවිහිංසාවාදී වැඩිදුර සංවර්ධනයක් හා පර්යේෂණයක් ලෙස යොදාගත යුත්තේ මේ ක්‍රමයයි.

තත්ත්වාකාර දේශපාලන රටාවන් අභියෝගයට ලක් කළ යුතු තවත් හේතුවක් වන්නේ, ප්‍රධාන ගැටුම් කලාපවල ඇති රාජ්‍ය පද්ධතීන් ප්‍රචණ්ඩත්වය සමනය කිරීමේලා ඇත්ත වශයෙන් ම අකාර්යක්ෂම වන අතර, ප්‍රචණ්ඩත්වය සමනය කිරීමට වඩා ඒවා ඇති කිරීමට සහ ඉදිරියට ගෙනයාමට සම්බන්ධ විය හැකිය. මේ නිසා එවැනි ප්‍රචණ්ඩත්වය ගැන කටයුතු කිරීමට සුදුසු ක්‍රියාවලියක් සොයා ගැනීමට අවශ්‍ය වන විශේෂ ආකාරයේ ගැටලුවලට ගැටුම් නිරාකරණ ක්‍රියාකාරීහු මුහුණපාති.

## 2.3 ප්‍රචණ්ඩත්වයේ දේශපාලනික ප්‍රභවයන්



මෑතක දී ඇති වූ සංකීර්ණ මානුෂික (හදිසි) අවදානම් අවස්ථා 17 ක් සම්බන්ධයෙන් සිදුකරන ලද විශ්ලේෂණයක දී, කලේවි හොලිට්සි තර්ක කරන්නේ (නෆ්සිගර් 2000, වෙළුම 2, 4 හි සඳහන් පරිදි) පහත දැක්වෙන දෑ ඇතුළුව මහා පරිමාණ සංවිධානය වූ ප්‍රචණ්ඩත්වයට දේශපාලනික සාධක හේතුවිය හැකි බවයි.

*වෙනස් වූ වර්ග, භාෂා හෝ ආගමික ජන කොටස් දෙකක් හෝ වැඩි ගණනක් අතර, හදිසි තත්ත්වයක් වර්ධනය වීමේ අවදානමක් පවතී; 1945 ට පසු නිදහස ඉල්ලා සිටින රටවල් අතර, රාජ්‍ය පාලනය විසින් එහි සුළුතර සමාජ කණ්ඩායම් පිටුවහල් කිරීම හෝ හිරිහැර කිරීම මගින් වෙනස් කොට සලකන විට දී සහ ආණ්ඩුවක දුර්වල නීතියක් පවතින විට දී, එසේ වීමේ ප්‍රවණතාවයක් ඇත.*

මේ සියල්ල ප්‍රචණ්ඩත්වය ඇති කරන්නා වූ ව්‍යුහාත්මක සංවිධාන වන අතර, වඩාත් ගැටුම් සංවේදී සංවර්ධන උපාය මාර්ග සඳහා ක්‍රමවේද සහ මෙවලම් මගින් හඳුනාගනු ලැබූ දේශපාලනික අවදානම් ලක්ෂණ සහ ප්‍රකාශවලින් ඒවා සමන්විත වේ. හොල්ට්සි අවස්ථා 17 ක් යොදාගෙන කරන ලද සිය අධ්‍යයනයෙන් තීරණය කරනුයේ ප්‍රචණ්ඩ හැසිරීම් ජනනය කර ඇත්තේ ජනවාර්ගික ප්‍රශ්න හෝ කණ්ඩායම් බෙදීම් මගින් නොව දේශපාලනඥයන් සහ රාජ්‍ය නිලධාරීන් ඔවුන්ගේ පාලනය යටතේ පවතින ජන කොටස්වල විවිධ කණ්ඩායම්වලට එරෙහිව සිතාමතාම සංවිධානය කරන ලද ප්‍රචණ්ඩත්වය යන්නයි.

*....ආණ්ඩු විසින් සිදුකරන ලද සංවිධානාත්මක දේශපාලන ඝාතන මඟින් කැරළි ද ඇතුළු ව අනෙකුත් ආකාරයේ සිවිල් යුද්ධවලට වඩා විශාල හානි ඇති කර තිබේ. එවන් හදිසි තත්ත්වයන් වැළැක්වීමට අන්තර් ජාතික ප්‍රජාවට, පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා තිබීම උපකාරී වී නැත (එම).*

වෙරිනෙන් (Väyrynen,ibid, 437) මෙම නිගමනය තවත් මෙසේ විග්‍රහ කරයි.

*මාගේ මූලික උපන්‍යාසය වන්නේ සමාජයේ මානුෂික අර්බුද ඇතිවන්නේ දුර්වල රාජ්‍ය පවතින විට සහ බුද්ධිමතුන් තමාගේ යහපත සලසා ගැනීමේ ගිජුකමින් පෙළෙන විටය. පශ්චාත් යටත්විජිත පිය උරුම - රාජ්‍යයක එක් ශක්තිමත් නායකයෙකු බල පිරමීඩයේ ඉහළ සිට සිවිල් සහ හමුදාමය ආයතනවල සිටින 'එහෙයියන්' ජාලයකට සහාය දෙයි. වඩාත් පරිධිමය රාජ්‍යයක දේශපාලනික පද්ධතියේ වාසි ලබන්නන් තීරණය කරනු ලබන්නේ, එහි මූලික අංග වන බල කිරීම් සහ අනුග්‍රාහකත්වය මගිනි.*

ඔහු මෙම උපන්‍යාසය වර්ධනය කරන්නේ කොල්ලකාරී රාජ්‍ය න්‍යාය සහ කුළියට ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාකාරකම් තුළින් දේශපාලනික සහ ආර්ථික අංශ අතර, ගතිකයන් විස්තර කිරීමට ය. එහි දළ ප්‍රතිඵලය වනුයේ රාජ්‍ය කොල්ලකෑම, සූරාකෑම සහ අරාජක අසාර්ථක රාජ්‍ය පද්ධති මෙන්ම, බලය මත විශ්වාසය තැබීම, බල කිරීම්, විරුද්ධවාදීන්ට එරෙහි රාජ්‍ය අනුග්‍රහය ඇතිව කෙරෙන සංවිධානය වූ ප්‍රචණ්ඩත්වය සඳහා අවකාශය ඇති වීම වේ.

ගැටුම් නිරාකරණ ක්‍රියාකාරීන් සිය මැදිහත්වීම් සඳහා උපාය මාර්ගයන් යෙදීමේ දී මෙම මූලික යථාර්ථයන් ඒත්තු නොගනී නම් නොදැනුවත්ව ම අසාධාරණය, දුර්වල ආයතනික පදනම් මත සාමකාමී මිථ්‍යාවන් ජනිත කරනු ඇත. රාජ්‍ය බලය සහ වෙළෙඳපොළ හුවමාරු පිළිබඳ බලය දූෂිත දේශපාලනඥයන් සහ නිලධාරීන් විසින් නොමග යවයි නම් එය තිරසාර සාමය පිළිබඳ බලාපොරොත්තු කිසිදා සඵල නොවීමට හේතු වේ. එවැනි වාතාවරණයක් තුළ අනෙකුත් සිවිල් සමාජ ආයතන තුළින් (පවුල්, ආගමික, අධ්‍යාපනික, සෞඛ්‍ය සහ අනෙකුත්) ක්‍රියාත්මක වීමෙන් සමාජ ඒකාබද්ධ බලයෙන් සන්නද්ධ කිරීමට උත්සාහ කිරීම හදිසි අවස්ථා සහන සේවයට සහ මානුෂීය සහායන්ට උපකාරී විය හැකිය. කෙසේ නමුත් එය මධ්‍ය හෝ දිගුකාලීන ස්ථිර සාමය ඇති නොකරනු ඇත. එයට 'පහසුව දැනෙන තත්ත්වය' වර්ධනය කළ හැකි නමුත් පාලන ක්‍රමයට සහ රාජ්‍ය පද්ධතියට ඔවුන් සමාජ කාර්යයන් ඉටු කිරීමේ ලා අපොහොසත් වීමේ දී තද පීඩනයක් ජනිත කරවනු ඇත. මෙම යහපත් මූලාරම්භ සැමවිට ම දූෂිත පාලන ක්‍රමයන්හි ක්‍රියා මගින් වෙනස් කරනු ලබන අතර, දේශපාලනය සාපරාධී කිරීමේ වර්ධනයක් ඇති වනු ඇත.

## 2.4 දේශපාලනය සාපරාධීකරණයඃ

මෙය හය වැදෑරුම් කේන්ද්‍රීය සංරචක මගින් නිරූපණය වේ. ඒවා නම් නීතියේ බලය කණපිට හැරවීම, දඬුවම් විනිර්මුක්තිය, සංවිධානය වූ අපරාධ, මත්ද්‍රව්‍ය, නීතිය බලාත්මක නොකිරීම සහ දූෂණයයි.

(i) **නීතියේ බලය කණපිට හැරවීම** : මෙය ලොව වටා, ගැටුම් කලාප බොහොමයක සිදු වී තිබේ. සියල්ලන්ට ම පළමුව පොලීසිය දූෂණය වේ; දෙවනුව අධිකරණයේ ස්වාධීනත්වයට අභියෝගයක් පවතින අතර, අධිකරණ පද්ධතිය බිඳ වැටේ. අරාජික රාජ්‍යයන්, උදාහරණ වශයෙන් සියරා ලියොන්, ලියිබීරියාව, සෝමාලියාව වැනි රටවල ගෞරව සම්පන්න අධිකරණ පද්ධතියක් නොමැතිව මධ්‍යම

අධිකාරිය සම්පූර්ණයෙන් කඩා වැටීමකට ලක් වූ අතර නීතිය ක්‍රියාවේ යෙදවීමට මාර්ගයක් නොමැති තත්ත්වයක් උදාවිය. කෙටියෙන් පවසතොත් මූලික ආරක්ෂාව සපයන්නන් වූයේ පෞද්ගලික මිත්‍රත්වය සහ ඥාති කණ්ඩායම් බව මින් අදහස් වේ.

(ii) **දඬුවම් විනිර්මුක්තිය** : නීතියේ බලය කණපිට හැරෙනවිට දඬුවම් විනිර්මුක්තිය හටගනී. දඬුවම් විනිර්මුක්තිය, රුවන්ඩාවේ සහ මුගාබේ පාලන ක්‍රම මගින් ක්‍රමානුකූලව නීතියේ බලය යටපත් කළ අතර, සිම්බාබ්වේ හි සිදු වූ පරිදි මහා පරිමාණ මානව හිමිකම් අපචාර සහ මනුෂ්‍ය ඝාතනවලට පවා හේතුවිණි. ඇතැම්හු දඬුවම් විනිර්මුක්තිය ලබති. ඇතැමුන්ට ඇතැම් තත්ත්වවල දී නීතියට ඉහළින් සිටීමට ආර්ථික සහ දේශපාලනික බලය උපකාර කෙරේ, එසේ බලයක් නො මැතිව හිතුවක්කාරී ලෙස දූෂණයට සහ නීතියෙන් පීඩාවට පත් වූ අය ද සිටීම සාමාන්‍ය තත්ත්වයකි. නිදසුනක් ලෙස, සාපේක්ෂ වශයෙන් දුර්වල සහ දුබල පුද්ගලයෝ සුළු පරිමාණ දූෂණ ක්‍රියාවල මෙන් ම ඉහළ මට්ටමේ දූෂණ ක්‍රියාවල ද විඳුවන්නන් බවට පත් වෙති. සුළු පරිමාණයේ දූෂණ සඳහා වගකීමට ඔවුන්ට සිදුවන අතරම, මිලියන ගණන් සොරකම් කර ඔවුනට දඬුවම් විනිර්මුක්තිය ලබා ගනු පිණිස බලය පාවිච්චි කරන්නේද ඔවුන්ට එරෙහිවය.

(iii) **සංවිධානාත්මක අපරාධ** : එක්සත් රාජධානියේ පසුගිය වසරේ ජාතික අපරාධ බුද්ධි සේවය ප්‍රකාශ කරන්නේ සංවිධානාත්මක අපරාධ බ්‍රිතාන්‍යයේ ආරක්ෂාවට විශාල තර්ජනයක් වී ඇති බවයි. එසේම සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ බොහෝ කලාපවල ප්‍රජාතන්ත්‍රවාදයට සහ ස්ථාවරත්වයට සංවිධානාත්මක අපරාධ ව්‍යාපාරය තර්ජනයක් වී ඇත. කොලොම්බියාව, ඇමෙරිකාව සමග වරදකරුවන් නැවත සිය රටට භාරදීමේ සම්මුතියක් ඇති කිරීම වැළැක්වීමට එරට මත්ද්‍රව්‍ය ව්‍යාපාරය ඍජුවම සම්බන්ධ විය. රට තුළට තහනම් භාණ්ඩ තීරු බදු ගෙවීමකින් තොරව ගෙන ඒම මගින් එරට කඩා වැටී ඇති ආර්ථිකය තවදුරටත් කඩා බිඳ දැමීමටත්, ප්‍රචණ්ඩ ක්‍රියා වර්ධනය කිරීමටත් කොකාසස් හි අපරාධ කල්ලි තර්ජනය කර තිබිණි. බෝල්කන්ස්හි අපරාධ කණ්ඩායම්, ජනාධිපති මිලසොවිච් යටතේ සර්බියාව වැනි අපරාධ රාජ්‍යයක් නිර්මාණය කරමින් රැඩිකල් ජාතිවාදී කණ්ඩායම් හා එකතු විය. කොසෝවෝ හි කොසෝවෝ විමුක්ති හමුදාව බටහිර ප්‍රදේශයේ ක්‍රියාත්මක වන ඇල්බේනියානු අපරාධ සංවිධාන සමග දැඩි සබඳතාවයක් පවත්වා ඇත. චීන ස්නේක් හෙඩ්ස් (Snake Heads) වැනි සංවිධානාත්මක අපරාධ කල්ලි ලොව පුරාම නීති විරෝධී ලෙස මිනිස් ජාවාරමේ යෙදී සිටිති. මෙය වෙනත් ආකාරයකින් හැඳින්වුවහොත් වහල්භාවය සඳහා මිනිසුන් සැපයීමයි. එක්සත් ජාතීන්ගේ සංඛ්‍යා ලේඛන අනුව සෑම වසරක ම ලොව පුරා පුද්ගලයෝ මිලියන හතරක් පමණ නීති විරෝධී ලෙස සංක්‍රමණය කෙරෙති. මෙම ගනුදෙනුවලින් ලැබෙන ඩොලර් බිලියන 5-7ත් අතර වන වාර්ෂික ලාභය ද සැලකිය යුතුය. සිදු වූ මානුෂික ඛේදාන්තය පසෙක තිබිය දී සංක්‍රමණිකයින් පිළිගත් ඇතැම් රාජ්‍යයන්ට සංක්‍රමණිකයන්ගේ එම පැමිණීම ද ගැටුම් ඇතිවීමට හේතුවක් විය හැකිය.

(iv) **මත්ද්‍රව්‍ය** : නීති විරෝධී මත්ද්‍රව්‍ය ව්‍යාපාරයෙන් ලබන වාර්ෂික ආදායම ඩොලර් බිලියන 500 ක් බව එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇස්තමේන්තු කරයි. මත්ද්‍රව්‍ය නිෂ්පාදනය (විශේෂයෙන් හෙරොයින් සහ කොකේන්) ආර්ථික වශයෙන් ආකර්ෂණීයව පවතිනතුරු බොහෝ රටවල මත්ද්‍රව්‍යවල

ස්ථිර බලපෑම එසේම පවතිනු ඇත. බටහිර රටවල ඇබ්බැහිවීමේ මට්ටම ඉරානය, ඉන්දියාව, හෝ පකිස්ථානයට සමාන හෝ එම රටවල් අභිබවා යයි. මත්ද්‍රව්‍ය බලපෑම හා සබැඳුණු ප්‍රශ්න, අන්තර්ජාතික ගැටුම්වලට තුඩු දිය හැකිය. උදාහරණ ලෙස ඇෆ්ගනිස්ථානයේ තලිබාන් පාලන සමයේ දී සහ එහි අසල්වැසි ඉරානය තුළ හෙරොයින්වලට ඇබ්බැහිවීමේ සැලකිය යුතු මට්ටමක් දැකිය හැකිය. ඉරාන වැසියන් මිලියනයක් පමණ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් ලෙස සලකනු ලබන අතර, තහනම් ඖෂධ වෙළෙඳම හා සම්බන්ධ සටන් කණ්ඩායම් 3000 කට අධික පිරිසක් ඉරාන පොලීසිය විසින් ඝාතනය කර ඇත. නීති විරෝධී භාණ්ඩ ජාවාරම්කරුවන් පැරණි සෝවියට් සමූහාණ්ඩුව, විශේෂයෙන් ටර්ක්මෙනිස්ථාන් හරහා හෙරොයින් යැවීමට තෝරාගෙන ඇති බවට මෑතක දී ලද සාක්ෂිවලින් පැහැදිලි වේ. මෙය අස්ථාවර රාජ්‍යයන් ඉක්මනින් බිඳදැමීමට හේතුවක් වනු ඇත. ඇෆ්ගනිස්ථානු දේශ සීමාවේ ඇති රටවල ඉස්ලාමීය කැරළිකරුවන්ගේ ක්‍රියාකාරකම්වලට මූල්‍යාධාර සඳහා මෙම ජාවාරමෙන් ලද ලාභය යොදා ගැනේ.

(v) **නීතිය බලාත්මක නොකිරීම** : ඇමරිකා එක්සත් ජනපදය විසින් කොලොම්බියාවට ඩොලර් බිලියන 1.3 ක යුද ආධාර ලබාදීම නිල වශයෙන් ඉලක්ක කෙරුණේ කොලොම්බියානු මත්ද්‍රව්‍ය ව්‍යාපාරය පාලනය කිරීම සඳහාය. කෙසේ වෙතත් කොලොම්බියානු හමුදාව මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා යොදාගැනීමට අදහස් කළ මෙවලම් වාමාංශික ගරිල්ලන්ට එරෙහි සටනට යොදාගත් බවට සාක්ෂි තිබේ. එමගින් විරුද්ධවාදී හමුදා අභ්‍යන්තර අවි තරගයට පිවිසීම නිසා සිවිල් යුද්ධයේ ක්‍රියාශීලීත්වයට ජවයක් සැපයේ. ඒ හා සමානව 2001 ජූලි මස දී ඇමෙරිකා එක්සත් ජනපදය, තලීබාන් පාලනයේ මත්ද්‍රව්‍ය නිවාරණ ව්‍යාපාරයට සහාය වශයෙන් ලබාදුන් මිලියන 34 ක් නිසැකව ම වත්මන් අර්බුදයට ජවය සැපයීමේලා යොදාගෙන ඇත. අපරාධවල පීඩාකාරී බව මෙන්ම අපරාධ හා ගැටුම් අතර අන්තර් ක්‍රියාකාරීත්වය - විශේෂයෙන් පාලකයන් හෝ සහායක කණ්ඩායම් ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට මුදල් උපයා ගැනීම සඳහා සංවිධානාත්මක අපරාධ භාවිත කරයි නම්-ගැටුම් නිරාකරණ ක්‍රියාවලීන් සැලසුම් කිරීමේ අවශ්‍යතා සඳහා වැඩි ප්‍රමුඛත්වයක් දිය යුතුය.

(vi) **දූෂණය** : සැබැවින්ම දූෂණය ලෝකයේ සෑම රටක ම පවතී. සාමාන්‍යයෙන් එය විටින් විට සිදුවන ස්වභාවික නීතිය කඩ කිරීමක් වන අතර, පෘථුල නිලධාරීවාදය මඟහැරීමට අත්‍යවශ්‍ය විකල්ප මාර්ගයකි. කෙසේ නමුත් අන්ත දූෂණය පවතින විටදී රාජ්‍යයේ ආචාර සම්පන්න බව පීඩනයට පත් වේ. 1999 දී පකිස්ථානයේ ඇති වූ කුමන්ත්‍රණයට ද විශාල හේතුවක් වූයේ බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනඥයන් විසින් කරගෙන ගිය දූෂණය නිසා ඇති වූ හමුදා අපේක්ෂා භංගත්වයයි. ඊට සමාන පිලිපීනයේ එස්ට්‍රාඩා පාලන සමය, විශේෂයෙන් දේශපාලනඥයන් විසින් බලය අපහරණය කිරීමෙන් අවදි වූ ජනතාවගේ බල රැළියක දී බිඳ හෙළනු ලැබීය. මේ හා සමාන සිදුවීමක් ඉතා මෑතක දී සර්බියාවේ සිදු විය. දූෂිත පාලකයෝ - සර්බියාවේ හෝ ඉන්දුනීසියාවේ මෙන් - ජනවර්ගයන් අතර, වෛරය, ජනප්‍රියත්වය ලබා ගැනීමේ මගක් ලෙස රඳවා තබාගනිති. එමෙන්ම චෞර සංස්කෘතිය බලවත්ව සහ පුළුල් ව ව්‍යාප්ත වූ විට ඉන් ඵල ප්‍රයෝජන ලැබූ අය ඔවුන්ගේ ආර්ථික ලාභ ආරක්ෂා කර ගැනීමට බලහත්කාරයේ හා සංවිධානය වූ ප්‍රචණ්ඩත්වයේ පිහිට පතති.

## 2.5 කලාපීය දේශපාලන බලපෑම්

රාජ්‍ය පද්ධතියේ බිඳවැටීම, නීතියේ බලය විනාශ වීම, කොල්ලකාරී රාජ්‍ය ක්‍රමය සහ සැලකිය යුතු සුළු ජාතීන් දේශපාලනික වශයෙන් කොන් කිරීම යන මේ සියලු දේම ගැටුම් සඳහා අභ්‍යන්තර ප්‍රභවයන් වේ. මෙම ගතිකයන් අසල්වැසි රාජ්‍යයන් හා බලසම්පන්න බාහිර බලවේග මගින් කුපිත කරවනු ලබයි. මෙම කලාපීය ගතිකයන් නිතරම ජාතික ගැටුම්වල ප්‍රධාන හැඩතල නිර්මාණය සහ විනිශ්චය කිරීම සිදු කරන අතර, අනු කලාපීය සහ කලාපීය ගැටුම් පද්ධතිය මඟින් හොඳින් ග්‍රහණය කර ගැනේ. දකුණු කොකාසස් හි, උදාහරණ වශයෙන් ප්‍රධාන අර්බුද දෙකක් ඇත (ජෝර්ජියා සහ ඇලුකාසියා අතර හා ආමේනියාව සහ අසර්බයිජානය අතර); මින් එකක්වත් ද්විපාර්ශ්වීයව විසඳිය නොහැක්කේ, රුසියානු රජය ප්‍රකට ව ලෙස අප්‍රකට ව සෑම සාකච්ඡා මේසයක ම සිටින බැවිනි. රුසියානුවන් ඇතුළත් නොවූ ඕනෑම ගිවිසුමක් ඔවුන් විසින් වෙනස් කරනු හෝ විනාශ කරනු ලැබේ. අප්‍රිකාවේ, නයිජීරියාව වැනි නියමු රාජ්‍යවල සහ පෙර යටත්විජිතවාදී රාජ්‍යයන්වල (එක්සත් රාජධානිය, බෙල්ජියම සහ ප්‍රංශය) ගැටුම් අර්ථකථනය, අවබෝධ කර ගැනීම සහ ගනුදෙනු කළ ආකාර කුඩා රාජ්‍යයන්ට බලපායි. උදාහරණ වශයෙන් බෙල්ජියම සහ ප්‍රංශය අතර, මහා විල් සම්බන්ධයෙන් ඇති ගැටුම් අර්බුද විසඳීමට සාකච්ඡාමය විසඳුමක් සඳහා උපකාරීවන කොන්දේසි ඇති නොකරයි. තව ද එක්සත් ජනපදය, යුරෝපා සංගමය හා/හෝ මැසිඩෝනියා හෝ ඊට පෙර උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (නේටෝ) වැනි බාහිර ක්‍රියාකාරීන් කොසෝවෝ හි ගැටුම් පාලනය වනු සහ ව්‍යාවර්තනය වනු දැකීමට ඇති කැමැත්ත තරමට ම කලාපීය සහ ජාතික මට්ටමෙන් සිය අවශ්‍යතාවන් පිළිබඳව ද උනන්දු වෙයි. මෙම සියලු දෑ අභ්‍යන්තර සහ බාහිර යථාර්ථයන් ග්‍රහණය කරගන්නා වූ දේශපාලන විශ්ලේෂණයක හා ඒවා ක්‍රමානුකූල ලෙස දැකීමේ වැදගත්කම යෝජනා කරයි.

ගැටුම්වල දී අතීතයේ මැදිහත්වීම්වල එක් අඩු ලුහුඬු බවක් බවට පත් වූයේ අන්තර් රාජ්‍ය, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන මට්ටමේ දී ආර්ථික සාධක සම්බන්ධයෙන් විශ්ලේෂණ හෝ මැදිහත්කරණ අවස්ථා හා සංයුක්ත වීමට අකමැත්තක් තිබීමයි. ප්‍රචණ්ඩ ගැටුම්, බලසම්පන්න ආර්ථික පෙළඹවීම් හා ප්‍රචණ්ඩත්ව පෝෂකයන්ට වැඩි අවධානයක් යොමු නොකොට දේශපාලනික සහ සිවිල් සමාජ මට්ටම්වල දී ප්‍රචණ්ඩ ගැටුම් නිරාකරණය කළ හැකි බවට උපකල්පනය කිරීමේ අතීත ප්‍රවණතාවයක් තිබිණි. මෙය ඇතැම් විට ඔවුන්ගේ ආර්ථික පදනමින් වෙන් වූ ලෙස දැකිය හැකි නා නා විධ සාකච්ඡා සහ කතාබහවල අභව්‍ය ලීලාවක් ඇතිවීමට හේතුවක් විය.

දේශීය, ජාතික, කලාපීය සහ ගෝලීය ආර්ථික පද්ධති සිවිල් සහ රාජ්‍ය යන දෙපාර්ශවයේ ම ක්‍රියාකාරකම්වලට සහාය වේ. ඒවා ප්‍රධාන වෙළඳපොළ බලවේග (පෞද්ගලික හා පොදු අංශවල) සමග ඇතැම් අවස්ථාවල සාම වෑයමට සහාය වන, ඇතැම් විට අපැහැදිලි සහ වෙනස් වූ ඒවාට ම ආවේණික ගතිකවලින් යුක්තය. ආර්ථික ක්‍රියාකාරකම් ගැටුම් නිරාකරණ ප්‍රජාව (නිල හා නිල නොලත්) විසින් සාපේක්ෂ වශයෙන් අවම - විශ්ලේෂණයට ලක් කර ඇති නමුත් මෑතක දී ලෝක බැංකුව, එක්සත් ජාතීන්ගේ සංගමය, ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයේ සංවර්ධන සහායක සභාව, සහ වේල්සයේ ව්‍යාපාරික නායකයන්ගේ සභාව, ඉන්ටර්නැෂනල් ඇලර්ට් වැනි ප්‍රධාන රාජ්‍ය නොවන සංවිධාන මෙම ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳව සාකච්ඡා කොට ඇත. මීට සම්බන්ධව

ස්වාධීන සංරචක තුනක් පවතී. සාපේක්ෂ සහ උපරිම හානිය සහ ගැටුම් තුළ මෙය රඟ දක්වන භූමිකාව පළමුවැන්න වේ. දෙවැන්න වන්නේ රජය සහ එහි වැසියන් අතර සමාජ ගිවිසුම බිඳ වැටීම සහ රජයට පෞද්ගලික අංශයේ වැසියන්ගේ සංවර්ධනීය සහ සුබ සාධක අවශ්‍යතා සපුරාලීමට ඇති නොහැකියාව හෝ අකමැත්ත වේ. තුන්වැන්න වන්නේ ස්වභාවික සම්පත් සඳහා සහ එහි පාලනය උදෙසා ඇති තරගය යි.

මෙම සියලුම ගැටලු ආරම්භ වනුයේ ක්ෂේත්‍රය තුළ ඒත්තු ගැන්වීම සඳහා වන අතර, සාමය සහ ගැටුම් බලපෑම් තක්සේරුව (Peace and Conflict Impact Assesment) ක්ෂුද්‍ර සහ සාර්ව මට්ටම්වල දී වඩා ගැටුම් සංවේදී සංවර්ධන ප්‍රවේශයක අවශ්‍යතාව දැඩි ලෙස ප්‍රකාශ කරයි.

## 2.6 ආර්ථික උන්නතිකාමී බව පෙළඹවීමක් ලෙස

ආර්ථික සාධක ගැටුම කෙරේ ප්‍රධාන බලපෑමක් ඇති කරයි. පෝල් කොලියර්, මැට්ස් බර්ඩාල්, ඩේවිඩ් මැලෝන් සහ අනෙක් බොහෝ අය දැඩි ලෙස තර්ක කර සිටින්නේ බොහෝ ගැටුම්, ස්වභාවික සම්පත් නිෂ්පාදනය සහ බෙදා හැරීම පාලනය කිරීම සඳහා වන තරගයක් යන අර්ථයෙන් පැහැදිලි කළ හැකි බවයි. මෙය සිදුකරනු පිණිස ගොඩනගා ඇති ආර්ථික මිතික ආදර්ශ අනුව ගැටුම් සහ දියමන්ති, රන් සහ කෝල්ටන් වැනි වටිනා ද්‍රව්‍ය අතර අපූරු සංයෝජනයන් මොනවට විදහා දැක්වෙයි. මෙම තර්කය තරයේ යෝජනා කරන්නේ ගැටුම් උත්පාදනය කිරීමේ ලා 'මැසිවිල්ල' මෙන් ම කෑදරකම ද එක සේ වැදගත් වන බවයි (Collier & H±ffler 1998). දේශපාලනික ගතිකයන් සමග මෙම ආර්ථික පෙළඹවීම්, ගැටුම් විශ්ලේෂණයට සාධක කරගත යුතුය. යුදවාදී හැසිරීමට එරෙහිව සාමකාමී බව උත්ප්‍රේරණය කිරීමට දිරිමත් කරවන සුළු ප්‍රමාණවත් යාන්ත්‍රණයන් සංවර්ධනය කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුය. 'දියමන්ති ගැටුම' සහ අනෙකුත් නීති විරෝධී ස්වභාවික සම්පත් අපයෝජනය - එනම් සියරා ලියොන්, ඇන්ගෝලා, කොන්ගෝ සහ සූඩානයේ දැව සහ තෙල් අනාගතයේ ගැටුම් ව්‍යාවර්තන කාර්යයයේ සැලකිය යුතු ලක්ෂණයක් වෙමින්, සම්පත් යුද්ධයක් කරා ගමන් කරයි.

මේවා, අභ්‍යන්තර ගැටුම්වලට හේතු අවබෝධ කර ගැනීමට ඉවහල්වන මූලික රාමුවක් බවට පත්වෙමින් පවතින, යුද්ධයේ දේශපාලන ආර්ථිකය සම්බන්ධ වඩාත් පැහැදිලි උදාහරණ වනු ඇත. වර්ධිත ආර්ථික ඒකාබද්ධතාව ඇතැමුන්ගේ අභිවෘද්ධිය සඳහා අවස්ථා ලබාදුන්න ද, එය ඇතැම් අය බැහැර කරන අතර, එමගින් ඔවුන්ට දුෂ්කරතා ඇති කරවයි; මෙය ප්‍රචණ්ඩ ගැටුම්වලට තුඩු දිය හැකිය. එය මේවා සිදු කරන ආකාරය අතිශයින් සංකීර්ණය.

වෙයින් නාෆ්සිජර් (Weyne Nafziger) සහ ජුහා ඔවිනන් (Juha Auvinen) හට මෙම ක්ෂේත්‍රය පිළිබඳ වඩා සිත්ගන්නා තර්කයක් තිබේ (Nafziger-2000). අඩු ඒක පුද්ගල ආදායම, අඩු හෝ ඍණ ආදායම සහ කෘෂිකාර්මික නිෂ්පාදනයේ සංවර්ධනයක් නැතිවීම ගැටුමකට හේතුවිය හැකි වැදගත් අංග බැව් ඔවුහු පවසති. තව ද, ඔවුන් සඳහන් කරන්නේ ඉහළ මට්ටමක පවත්නා අසමානත්මතාවය - විශේෂයෙන් ආගමික, වාර්ගික හෝ පංති අතර ඉහළ අසමානත්වයක් පෙන්වයි නම් එහිදී ද ගැටුමකට නැඹුරුතාවයක් පවතින බවයි. කණ්ඩායම් අතර සිරස් අසමානාත්මතාවය, ගැටුමක ආර්ථික ප්‍රභවයන්

පිළිබඳ අවධානය යොමු කිරීමේ වැදගත් වර්ධනීය කණ්ඩායමක් වන්නේ, එය සංවර්ධන සහ ආර්ථික උපකාරී වැඩසටහන් සඳහා වැදගත් මාර්ගයක් යෝජනා කරන බැවිනි. නෆ්සිගර් සහ ඔව්නන් විසින් ප්‍රචණ්ඩ ගැටුම් හා දැඩි ලෙස අනුබණ්ඩනය වන ආර්ථික නොවන අංග ලෙස හඳුනා ගෙන ඇත්තේ යුද වියදම් සහ ගැටුමේ අතීත ඉතිහාසයයි.

දිගු කාලයක් තිස්සේ ගැටුම් විශ්ලේෂකයන් පැරණි සාහිත්‍යයේ ඇතුළත් යුද දේශපාලන ආර්ථිකය නොසලකා හැරීම මඳක් විස්මය දනවන්නකි. එහෙත් එය යළි සොයාගැනීම සහතික වී ඇති අතර, එය දැන් මුල් බැස ඇති සහ සොයාගත නොහැකි අභ්‍යන්තර ගැටුම් නව චින්තනයේ මධ්‍ය ලක්ෂ්‍යයේ ස්ථානගත කොට ඇත. මෙම සිතුවිලි තම "ප්‍රචණ්ඩත්වයේ වෙළඳපොළවල්" කෘතියෙන් වැඩි දුරගෙන ගිය එක් කතුවරයෙකි, ජෝර්ජ් එල්වර්ට් (කොටුව 01 බලන්න).

**කොටුව 01: ප්‍රචණ්ඩත්වයේ වෙළෙඳපොළවල්**

ප්‍රචණ්ඩත්වයේ වෙළඳපොළවල් ලෙස සැලකෙන්නේ සිවිල් යුද්ධ, යුද නායකයින් හෝ කොල්ලකෑම් මගින් පාලනය වන ආර්ථික ක්ෂේත්‍රය ලෙසය. මෙයින් ප්‍රචණ්ඩකාරී නොවන භාණ්ඩ වෙළෙඳපොළ සමග භාණ්ඩ ප්‍රචණ්ඩකාරී ලෙස අත්පත් කර ගැනීම හා සම්බන්ධ වන ස්වයං චිරස්ථායී පද්ධතියක් පැන නගී. මෙය ප්‍රචණ්ඩත්ව සහ අවිහිංසාවාදී දෙයාකාරයේම එකතුවකින් ඇතිවන ලාභයකි. නීතිගත කිරීමේ උත්සාහයක් පැවැතිය ද, සදාචාරත්වයේ මතුපිටට යටින් ලෝක දෘෂ්ටියක් සහ බල අරගලයන් අතරින් ස්වයං- පාලනමය ආර්ථික රටාවන් බිහිවෙයි. එහි ක්‍රියාකාරීන්ගේ අරමුණු කුමක් වුවත්, (නිදහස, ගෞරවය සහ පළිගැනීම වැනි) ලාභය පමණක් අරමුණු කරගත් අය පමණක්, ඔවුන්ගේ වෙනත් අරමුණු නොසලකමින්, මෙහිදී සාර්ථකභාවයට පත් වෙති.

කොංගෝවේ/ සයරේහි රත්තරන් සහ දියමන්ති ජාවාරම, සෝමාලියාවේ මත්ද්‍රව්‍ය ජාවාරම, කොලොම්බියාවේ එමරල්ඩ් ජාවාරම මෙන්ම අවසන් වශයෙන් සූඩානයේ, සෝමාලියාවේ, ලියිබීරියාවේ සහ බොස්නියාවේ ආහාර පටවාගත් වාහන, මෙකී 'ආරක්ෂාව' පසුගිය කාල සීමාවේ දී ආදායම් උපයා ගැනීමේ වැදගත්ම මාර්ගය කරගෙන ඇත. සිය පාලන ප්‍රදේශ හරහා බෙහෙත් ද්‍රව්‍ය පටවාගත් ලොරි ගමන් කිරීම සඳහා ලයිබීරියානු යුද නායකයෙක් ආධාර සංවිධානයකින් එක් ලොරියකට ඇමෙරිකානු ඩොලර් 1000 ක කප්පමක් 1994 දී අය කළේය.

ප්‍රචණ්ඩත්වයට විවෘතව ඇති, භාවිතයට ගත හැකි සම්පත් හා තදනුරූප වෙළෙඳපොළවල් පවතින ස්ථාන සහ ආර්ථිකමය වටපිටාව නිහඬ හා ලාභදායීව ලෙස පවතින ස්ථානවල ද ප්‍රචණ්ඩකාරී වෙළෙඳපොළවල් ද අඛණ්ඩව පවතිනු ඇත.

ආරංචි මාර්ගය - එල්වර්ට් 1999

ආර්ථික සංරචක සඳහා වූ මෙම නවීකරණය වූ අවධානය, පීඩිත ජනතාව යුද්ධයෙන් ඉවත් කොට සාමය වෙතට සමීප කරවීම සඳහා වඩා ගැටුම් සංවේදී සහ ආර්ථික ලාභ ලබාදීමෙහි සමත් ජාත්‍යන්තර ප්‍රජා සංවර්ධන ප්‍රතිපත්තිවල වෙනසක් ඉල්ලා සිටී. ගැටුම්වලින් පීඩාවට පත් උපසහරා, අප්‍රිකා හෝ කොතැනක හෝ වේවා මෙම ආර්ථික පරිමාණයන් ගැටුම් සඳහා තීරණාත්මක පෝෂක වේ. වඩා ආශ්චර්යමත් මූලිකාංග වෙනුවෙන් ඒවා නොසලකා හැරීම යනුවෙන් අදහස් වන්නේ, ඒවා නිරාකරණය කිරීමට ඇත්තේ ඉතා පටු අවස්ථාවක් බවයි. දේශපාලන ආර්ථික අංශ අනාගතයේ උත්පාදනය කරන ගැටුම්වලට, අවිධිමත් බහු ජාතික වෙළෙඳ ජාලය, දුර්වල ජාත්‍යන්තර මූල්‍ය පද්ධතිය, සහයෝගීතා බලය සහ වෙළඳ ප්‍රතිපත්ති සහ ආධාර මත බලපෑම යන අංග ද ඇතුළත් වනු ඇත.

### (i) අවිධිමත් බහු ජාතික වෙළෙඳ ජාලය

දියමන්ති, දැව, තෙල් හෝ අනෙකුත් ස්වභාවික සම්පත්, මත්ද්‍රව්‍ය හා තුවක්කු වේවා යුද භාණ්ඩවල අවිධිමත් සහ තහනම් වෙළෙඳම, බොහෝ ගැටුම්වල පැවැත්මට ඉවහල් වේ (ඩෆීල්ඩ් 1994 බලන්න). යුද්ධයට අදාළ පාර්ශවයන් මෙම වෙළෙඳ භාණ්ඩවලින් උපයා ගන්නා ආදායම යුද්ධයේ චිරස්ථායි බවට මහරු දිරියක් වන අතර ජාත්‍යන්තර ප්‍රජාව මෙම භාණ්ඩ ප්‍රවාහනය විධිමත් කිරීමේ මාර්ග සහ ගැටුමට ඉවහල්වන මූල්‍යාධාර සීමා කිරීමේ මාර්ග සෙවීමේ නිරත වනු ඇත.

### (ii) දුර්වල ජාත්‍යන්තර මූල්‍ය පද්ධතිය

1997 හා 98 කාලයේ දී ආසියාවේ සිදු වූ මූල්‍යමය අර්බුද වසංගතය අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවලට ව්‍යාප්තවීම, ජාත්‍යන්තර මූල්‍ය පද්ධතියේ දුබලතාව සහ එය ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍යතාවන් පෙන්නුම් කළේ ජාත්‍යන්තර මූල්‍යායතන සහ වෙනත් අදාළ ආයතන දානපතියන්ට මෙන්ම ග්‍රාහකයන්ට ද පාරදෘශ්‍යතාව හා වගකිව යුතු පරිදි ආයතන පිහිටුවීම කෙරෙහි අවධානය යොමු කරවීමයි. මුලදී එතරම් ම ඇගැයුමකට ලක් නොවුව ද නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිසංස්කරණ, දේශපාලනික අස්ථාවරභාවය සහ ගැටුම අතර ඇති සම්බන්ධතාවයේ වැදගත්කම දැන් ගොඩනැගෙමින් පවතී. උදාහරණ වශයෙන්, ඉන්දුනීසියාවේ ආරම්භ කළ ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ආචේ සහ අනෙකුත් පළාත්වල ඉහළ යන ප්‍රචණ්ඩත්වය අතර, තර්කානුකූල සම්බන්ධතාවයක් ඇත. සූසාන් වුඩ්වෝඩ් (1995) තර්ක කරන පරිදි බෝල්කන්ස් හි දේශපාලනික විපර්යාසයන්, ඇත්ත වශයෙන් ම ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලි මගින් සංකීර්ණ කර ඇත. කෙසේ නමුත්, මෑතක දී සිදු කළ අධ්‍යයනයක දී ක්‍රිස්ටියන් මොරිසන් (නෆ්සිජර් 2000, වෙළුම 2,4 මගින් පෙන්වා දී ඇති) යෝජනා කරන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල චිරස්ථායි කිරීමේ වැඩසටහන් කිසිදු සැකයකින් තොරව දේශීය වශයෙන් අසංතුෂ්ටිය ඇති කරන මුත් මහා පරිමාණ සංකීර්ණ මානුෂික අවදානම් තත්ත්වයන් ඇති නොකරන බවයි.

*ඔහු (මොරිසන්) 'මෘදු මැඩලීම්' (උදාහරණ වශයෙන් වර්ජනය සහ පෙළපාලි වලට සම්බන්ධවීම් හා මරණයට තුඩු දිය හැකි සීමිත දේශපාලන අස්ථාවරභාවය) සහ ප්‍රචණ්ඩ ක්‍රියාදාමයකින් යුත් දැඩි මැඩලීම් අතර වෙනස පැහැදිලි කරයි. 1980 සහ 1996 දශකවලදී අප්‍රිකාවේ සහ ලතින් ඇමෙරිකාවේ ආරාවුල් බේරුම් කිරීමේ ඉතිහාසය පෙන්වා දෙන්නේ, ආරාවුල් නිරවුල් කිරීමේ ප්‍රතිපත්ති සෑම විට*

575

*සමාජමය වියදම් ඇති කරන නමුත් ඒවා මානුෂික අවදානම් තත්ත්ව නොව සමාජ වටිනාකම හා සම්බන්ධ ඒවා වන බවයි.*

මෙම තර්කයේ දී අන්තර්ජාතික මූල්‍ය අරමුදල (IMF) සහ අනෙකුත් මූල්‍යායතනවල ක්‍රියාකාරකම් කෙටි කාලීනව ජනගහනයේ සීමිත කොට්ඨාසවලට සීමිත ලෙස තීව්‍ර මානුෂීය හදිසි අවස්ථා ඇති කළ හැකිය. කෙසේ වෙතත්, මොරිසන් යෝජනා කරන්නේ ඒවාට ගැටුමට මූලික හෝ විශාල හේතුවලට වඩා ගැටුමක් වර්ධනය කිරීමේ හැකියාවක් ඇති බවයි.

**(iii) ජාත්‍යන්තර සමායතන බලය :**

ජාත්‍යන්තර සමායතන (TNC) බොහෝ අභ්‍යන්තර අර්බුදවල (ඇන්ගෝලාව, සූඩානය, කොලොම්බියාව සහ නයිජීරියාව වැනි) ප්‍රධාන ක්‍රියාකාරීහු වෙති. ඔවුන් නියෝජනය කරන ආර්ථික අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු අතර මේවා අර්බුදයන්ට හේතු වූ අවස්ථා පිළිබඳව බොහෝ උදාහරණ සැපයිය හැකිය (උදාහරණ වශයෙන් නයිජීරියාවේ ෂෙල් සහ නයිජීරියාවේ BP හි ක්‍රියාකාරකම්). තවද, ජාත්‍යන්තර සමායතන සතු ධනය හා සම්පත් අනෙකුත් රාජ්‍ය හා එසේ නොවන ක්‍රියාකාරීන්ට පෙන්වා දෙනුයේ තමන්ගේ බෙලහීන බව සහ ආර්ථික කටයුතු කෙරෙහි බලපෑම් කිරීමට ඇති නොහැකියාවයි. ජාත්‍යන්තර සමායතනවලට ප්‍රචණ්ඩත්වය ජනිත කරවනසුලු ඔවුන්ගේ ආයෝජන, රැකියා සහ අනෙකුත් තීරණ සම්බන්ධයෙන් වගකීම පිළිබඳව වඩා අවධානයක් යොමු කළ යුතු බවට වර්ධනය වන පිළිගැනීමක් ඇත. එමෙන් ම ඔවුන් සේවය කරන ප්‍රදේශය තුළ ගැටුම් නිරාකරණයට සහායවීමේ දී අනුමත ලෙස දායක වීමේ අවස්ථාවල වර්ධනයක් ද දක්නට ඇත (International Alert 2000).



**(iv) ආධාර සහ වෙළෙඳ ප්‍රතිපත්තිවල බලපෑම:**

සංවර්ධනය සහ ගැටුම් අතර සම්බන්ධතාවය සහ ජාත්‍යන්තර ප්‍රජාව යුද්ධයෙන් බලපෑමට ලක් වූ රටවල්වලට සහාය දක් වූ ආකාරය, අර්බුදය අවම වීම වෙනුවට, වර්ධනය වන ආන්දෝලනාත්මක ප්‍රශ්නයක් වී පැවතිය හැකිය. මානුෂීය ආධාරවල ක්‍ෂණ බලපෑම වන්නේ අනෙකුත් ගැටුම් මාර්ග හා සසඳන කල්හි සාපේක්ෂ වශයෙන් අවමවීම නමුත් (රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු) ඇතැම් අය එය දායකත්ව අංශයක් සේ සලකති. එය ආණ්ඩුවලට දේශපාලනික වශයෙන් තල්ලුවක් සපයනු ලබන අතර, යුදමය කාර්යයන් සඳහා ඉතිරි කරගත් මුදල් උපයෝගී කරගනිමින් දායකයන්ට සමාජ පිරිවැය හිලව් කරදෙයි (Uvin 1998). කොංගෝ යුද්ධය මීට හොඳම උදාහරණයක් වේ. සංවර්ධන ආධාර වර්ධනාත්මක ලෙස විශාල ගැටුම් සංවේදීතාවයන්ට අනුබල දීම අපේක්ෂිත නමුත් ජාතික සහ බහුපාර්ශ්වික වශයෙන් දායකවන නියෝජිත පාර්ශ්වයෙන් මෙම ගැටුම් සංවේදීතාවය ප්‍රබල ආකාරයෙන් ඇති කිරීම සහතික වීම වඩා අසීරුවනු ඇත. වඩා පුළුල් සංවර්ධන විවාදවල දී, ලෝක වෙළෙඳ සංවිධානවලට එහි ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවලට සහ වඩා විනිවිද වීම උදෙසා ලෝක වෙළෙඳ සංවිධානය පීඩනයකට පත් වී ඇති හෙයින් සංවර්ධනය වෙමින් පවතින රටවල දිළිඳු බව මර්දනය කිරීමට වෙළෙඳ සබඳතා බලපාන ආකාරය මත නවීකරණය වූ අවධානයක් අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් වී ඇත. යුරෝපා සංගමය දැනටමත් එහි වෙළෙඳ ප්‍රතිපත්ති, ගැටුම්වලට බලපෑ හැකි ආකාරය පිළිබඳව අප්‍රිකානු, කැරිබියානු සහ පැසිෆික් රටවල් හා

කොන්ටනු (Contonu) ගිවිසුම මගින් අවධානය යොමු කර තිබුණ ද ලෝක වෙළෙඳ සංගමය වෙත මෙම ගැටලුවලට පිළියම් සෙවීමට අනාගතයේ දී බල කෙරෙනු ඇත.

අනාගත ගැටුම්වලට බලපෑම් ඇති කළ හැකි පාරිසරික ගැටලු වැනි අනෙකුත් සාධක ද ඇත. මේවා තීව්‍ර වන්නේ හෝ මෙහෙයවනු ලබන්නේ සම්පත් හීනතාව මත ද බහුලත්වය මත ද යන්න විවාද සහගතය. ආරක්ෂිත සහ පිරිසිදු පානීය ජලයට ඇති හැකියාව සම්බන්ධයෙන් අනාවැකි පළ කරන ලද ගැටුම්වලට පණ පොවනුයේ දුර්ලභභාවයයි. ධනය උත්පාදනය කරන්නා වූ ඛණිජ සම්බන්ධයෙන් ගැටුම් ඇතිවන්නේ පවතින ධනය ආරක්ෂා කිරීම මෙන්ම තවත් වර්ධනය කර ගැනීම සම්බන්ධයෙනි. උදාහරණ වශයෙන් ෆෙයාර්හෙඩ් තර්ක කරන්නේ ධනය උත්පාදනය කරන සම්පත්වල පාලනය ලබාගැනීමට කණ්ඩායම් පරිශ්‍රමයක් දරන හෙයින් දිළිඳුභාවයට වඩා පාරිසරික සම්පත්, පාරිසරික ගැටුම් උග්‍ර කරන බවයි (Fairhead in, Nafzigar, 2000.Vol I. 147-179). සම්පත් පාලනය උදෙසා වෑයම් කරන ධනවත් හෝ දේශපාලනික වශයෙන් සම්බන්ධ කණ්ඩායම් අතර, සමාජය බෙදෙන අතර, එම අරගලය සඳහා පාබල සෙබළුන්වන්නේ දුගී ජනතාවය.

## 2.7 දිගුකාලීන ගැටුම් ගතික

ප්‍රචණ්ඩ ගැටුම් මත අධික බලපෑමක් ඇති දිගුකාලීන ගෝලීය ගතිකයන් කිහිපයක් ඊ ළඟ වසර 15 ත් 20 ත් අතර පවතිනු ඇත. මේවායින් බොහොමයකට ඒවා සමග කටයුතු කිරීම සඳහා නිර්මාණය වූ ජාතික මෙන්ම අන්තර්ජාතික ප්‍රතිපත්ති ද අවශ්‍ය වේ. එවන් සංරචක තුනක් වන්නේ ජනගහණය, සරණාගතයන් සහ අභ්‍යන්තරිකව අවතැන් වූවන් (IDP) සහ විදෙස්ගතව වෙසෙන්නන්ය. 

- **ජනගහන අංශය** කෙරෙහි අනාගත ගැටුම් ප්‍රභවය පිළිබඳ සැලකිලිමත්වීමේ දී අවධානය යොමු කළ යුතුය. මන්ද, මෑත බොහෝ සිවිල් යුද්ධවලදී සටන් කරනු ලැබූ තරුණයෝ එක්කෝ විරැකියාවෙන් පෙළෙන හෝ ඌන රැකියාවන්හි නියුතු පුද්ගලයෝ වෙති. ලෝක ජනගහනය 2001 දී බිලියන 6.1 සිට 2015 දී බිලියන 7.2 දක්වා වර්ධනය වීමට අපේක්ෂිතය. මින් සියයට අනූ පහක් අයත් වනුයේ වේගයෙන් නාගරික ප්‍රදේශයන් විස්තීර්ණය වන්නා වූ සංවර්ධනය වෙමින් පවතින රටවලටය. මෙකී බොහෝ රටවල් දුර්වල දේශපාලනික පද්ධතියක් ඇතිවීම හේතුවෙන්, ජනගහන වර්ධනයේ සහ නාගරීකරණයේ සංයෝගය නිසාත්, ග්‍රාමීය ප්‍රදේශ තුළින් සම්පත් ආකර්ශනය කර ගැනීම සහ දැනටමත් වෙහෙසට පත් වී ඇති ශ්‍රම වෙළඳපොළ පීඩාවට පත් කිරීමෙන් ද අස්ථාවරත්වයට දිරිදෙයි. බොහෝ රාජ්‍යයන්වලට දැන් අවුරුදු 15 ට වඩා අඩු ළමයි (උදාහරණ වශයෙන් ඇල්ජීරියාවේ සියයට හැටක්) විශාල සංඛ්‍යාවක් සිටිති. සමහර ගැටුම් ඇතිවිය හැකි කලාපවල විරැකියාවෙන් හෝ ඌණ රැකියාවෙන් පෙළෙන්නා වූ තරුණයන්, ඔවුන්ගේ ඉලක්ක යථාර්ථයන් බවට පත් කර ගැනීම සඳහා ප්‍රචණ්ඩත්වය භාවිත කිරීමට ප්‍රවණතාවක් ඇති දේශපාලනික ව්‍යාපාරයන්ට සම්බන්ධවීමෙන් 'අහිමිවීමට කිසිවක් නැතැ'යි සිතන මිනිසුන් සැපයීම සිදු කරයි. මේ මිනිසුන්ගෙන් බොහෝ දෙනෙකුට ජීවත්වීම සඳහා මුදල් ඉපැයීමට සාධාරණ මාර්ගයක් සෙවීම සමග සංසන්දනය කිරීමේ දී ඔවුන්ගේ දිවි පැවැත්ම උදෙසා කොල්ලකෑම හෝ පැහැර ගැනීමට හැකියාවක් ඇති සන්නද්ධ කල්ලිවල සිටීම වඩා පහසු ලෙස දැනෙනු ඇත.

- **ලෝක සරණාගත තත්ත්වය** මගින් කලකිරීම ජනිත කිරීම එසේම පවත්වාගෙන යන අතර, එමගින් හමුදාවන්ට හා නිල නොවන හමුදාවන්ට රැකියා පසුබිමක් සපයයි. 1970 දී සිටියේ සරණාගතයින් මිලියන දෙකක් පමණි. එක්සත් ජාතීන්ගේ සරණාගතයන් සඳහා මහ කොමසාරිස් කාර්යාලයට (UNHCR) අනුව එය වසර 2001 වන විට මිලියන 21 කට වඩා වැඩි වී ඇත. පලස්තීන සරණාගතයින් සම්බන්ධයෙන් කිසිදු විසඳුමක් පෙනෙන තෙක් මානයක නොපෙනෙන හෙයින් මැද පෙරදිග එම කොටසේ ගැටුම් එලෙසම පැවතීම සහතිකය. බටහිර සහ මධ්‍යම අප්‍රිකාවේ, මධ්‍යම ආසියාවේ සහ කොකාසස් හි විශාල සරණාගත කණ්ඩායම්, අයාලේ යාමට ඉඩ හැරියහොත්, ගරිල්ලා කණ්ඩායම් ලෙස බිහිවීමට ඉඩ ඇත. නිදසුනක් ලෙස ඇෆ්ගනිස්ථානයෙන් මෑතක දී පැමිණි සරණාගතයෝ පාකිස්ථාන සහ එම කලාපය අස්ථාවර බවට පත් කරමින් සිටිති. මෙම මහා මානුෂීය ව්‍යසනයන් අනාගත අර්බුදවල ප්‍රධාන ප්‍රභවයන් නියෝජනය කරන බැව් සැලකිය යුතුය. මීට අමතරව අප්‍රිකාවේ සහ වෙනත් ස්ථානවල අභ්‍යන්තරව විතැන් වූවන් මිලියන ගණනාවක් සිටින අතර, ඔවුන්ට පිළිසරණ නොවුවහොත් ගැටුම් විභව මූලාශ්‍රයක් වනු ඇත.
- **සංක්‍රමණික කණ්ඩායම** පිටුවහල් කළ හෝ මව් රටින් නෙරපූ හෝ සංක්‍රමණික කණ්ඩායම් ඔවුන්ගේ මව් රටේ ගරිල්ලා ව්‍යාපාරයට නිරතුරු අරමුදල් සපයති. උදාහරණ වශයෙන් ශ්‍රී ලංකාවේ විමුක්ති සටන්කරුවන්ට එතෙර දෙමළ ජනතාව සෑම වසරක ම ඩොලර් මිලියන ගණනක් එවන බවට අනුමාන කෙරේ. සිංහල සහ දෙමළ විදේශගතවූවන් පිළිබඳව උනන්දුවකින් තොරව ශ්‍රී ලංකාවේ අර්බුදය විසඳීමට උත්සාහ කිරීම එම අර්බුදය පිළිබඳ අර්ධ විසඳුමක් පමණි.



## 3. ව්‍යාවර්තනය වෙමින් පවතින ප්‍රචණ්ඩ ගැටුම් තුළ සාමය ගොඩනඟන්නන්ගේ භූමිකාව සහ සාධාරණ සාම ප්‍රවර්ධනය

මෙම විශ්ලේෂණය අනුව සංවිධානාත්මක ප්‍රචණ්ඩත්වයේ සමහර ව්‍යූහාත්මක ප්‍රභවයන් සාමය ගොඩනඟන්නන් මුහුණ පාන අභියෝග, ඔවුන්ට ඒවාට ප්‍රතිචාර දැක්වීමේ වත්මන් හැකියාවට වඩා බෙහෙවින් විශාලය. මින් අදහස් වනුයේ ඔවුන් හැකි සෑම තැනක දී ම ඔවුන්ගේ සම්පත් උපරිම කර ගැනීමට රාජ්‍ය, අන්තර් රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන අංශයේ ද ඒ සඳහා කැමැත්තක් දක්වන ක්‍රියාකාරීන් සමග සහයෝගය සහ ධනාත්මක සේවා සම්බන්ධතා පවත්වා ගැන්ම ද වැදගත් වන බවයි.

මෙම සාකච්ඡා කාර්යයන් සඳහා මූලික වැදගත්කම පථ II හි මුල පිරීම් සඳහා දෙනු ලබන අතර, ඒවා පථ I සහ පථ II/2 හි ශ්‍රේණිගත කරනු ලබන්නේ ගැටුම්වල මෙම කර්කශ දේශපාලනික සහ ආර්ථික ගතිකයනට පිළියම් යෙදීමට ය.

උදාහරණ වශයෙන්, දිගුකාලීන ගැටුම් ව්‍යාවර්තන ක්‍රියාවලියේ යෙදීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවල ගැටුම් නිරාකරණ සහ සාමය ගොඩනැංවීමේ අංශය වඩ වඩාත් සම්පත් අත්පත් කරගනිමින් විස්තීරණය කරමින් සහ වෘත්තීයකරණය කරගනිමින් පවතී. කෙසේ නමුත්, උතුරේ එය ඉතා ප්‍රබලව පවතී. එම සම්පත් ලෝකයේ හමුදා සහ රාජ්‍ය නොවන සන්නද්ධ ක්‍රියාකාරීන් සතු සම්පත් හා සසඳන කල අවම මට්ටමක පවතින අතර සංවිධානය වූ ප්‍රචණ්ඩත්වයේ දේශපාලනික සහ ආර්ථික ගතිකයනට

අභියෝග කිරීමට ඊට ඇත්තේ සීමිත හැකියාවකි. එයට සත්‍ය වශයෙන් ම දේශපාලනය සාපරාධී වීම, පිරිහුණු රාජ්‍ය, කොල්ලකාරී රාජ්‍ය, ආයතනගත වූ දූෂණය සහ පුළුල්ව පැතිරුණු නීතියේ බලය යටපත් කිරීම හා කටයුතු කිරීමේ අපහසුතාවයක් පවතී. රාජ්‍ය නොවන අංශයේ සංවිධානවලට, 'ශරීර ශක්තියෙන් මැදිහත්වීමට'වත් ප්‍රශ්නවලට විසඳුම් බලාත්මක කිරීමටවත් හැකියාවක් නැත. එහි ශක්තිය රඳා පවතින්නේ වෙනත් ක්ෂේත්‍රවලය. එයට දේශපාලනික සම්බාධකයකින් තොරව මානුෂික පීඩාවන්වලට ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය නම්‍යතාව සහ ශක්‍යතාව තිබේ.

ප්‍රචණ්ඩත්වය ව්‍යාවර්තනයේ දී සහ සාධාරණ සාමය ප්‍රවර්ධනය කිරීමේ දී එයට අර්බුද කලාපවල සිටින ස්වදේශීය ජනතාව හවුල් කරගෙන ක්ෂණික පීඩාවන් සඳහා ප්‍රතිචාර දැක්විය හැකිය. ඒ සමග ම එයට අර්බුදය තුළ සිටින්නන් හා සාකච්ඡා කඩිනම් කිරීම, ඔවුන්ගේ ගැටලු විසඳීම සහ ඔවුන්ගේ මිනිස් අවශ්‍යතා සපුරාලීම අන්තර්ගත වේ. එය සූක්ෂ්ම අවබෝධය භාවිත කොට ආර්ථික සංවර්ධනය සහ මිනිස් ආරක්ෂාව සම්බන්ධයෙන් වූ බහුපාර්ශවීය සංවිධාන සහ දානපතියන්ගේ සාර්ව - ප්‍රතිපත්ති තීරණවලට බලපෑම් කරන අතර ම එයට එසේ කළ හැකිය.

ඇතැම් විට රාජ්‍ය නොවන සංවිධානවල භූමිකාව වන්නේ ගැටුම් පාර්ශ්වයන් අතර සන්නිවේදනය කඩිනම් කරවීමයි. තවත් අවස්ථාවල එහි භූමිකාව වඩා විශ්ලේෂණීය වන අතර වඩ වඩාත් සාකච්ඡාමය ආකාරයකින් ක්‍රියාත්මක වේ (උදා: අන්තර් ක්‍රියාකාරී ගැටලු විසඳීමේ වැඩමුළු). කෙසේ නමුත් මේ සියලු ක්‍රියාකාරකම්වල මූලික ඉලක්ක එකකි. බොහෝ ගැටුම් ව්‍යාවර්තනීය රාජ්‍ය නොවන සංවිධාන සහ විද්වත්හු, මානව පැවැත්ම සහ ආරක්ෂාව උදෙසා ශක්තිමත් සහ නම්‍යශීලී සමාජයක් මූලික පූර්ව අවශ්‍යතාවක් වෙතියි යන උපකල්පනය මත පිහිටා සමාජය විභේදනයකට ලක් කිරීමට නොව එක්සත් කිරීමට උත්සාහ කරති. 579

කෙසේ වෙතත්, පවතින විවාදවලින් පැහැදිලිවන කරුණක් වනුයේ ගැටුම් ව්‍යාවර්තනය සහ සාධාරණ සාමය සඳහා නම්‍යශීලී සහ ඉවසිලිවන්ත ජන සමූහයක් අවශ්‍ය වන නමුත් එය ප්‍රමාණවත් කොන්දේසියක් නොවන බවයි. ජන කොට්ඨාසවල විසුරුණු සහ ඛණ්ඩනය වූ ස්වභාවය නිසා ඒවා සංවිධානාත්මක ආර්ථික සහ දේශපාලනික තත්ත්ව පරීක්ෂාවකට භාජනය කිරීම අපහසු වේ. කෙසේ නමුත්, ආර්ථික හා දේශපාලනික බලය අසංවිධිත වූ මෙම ක්ෂේත්‍රවල කුඩා ජන සංවිධානයක් බෙහෙවින් ඵලදායී විය හැකිය.

මානුෂීය රාජ්‍ය නොවන සංවිධානවලට ඔවුන්ගේ යහපත් අභිමතාර්ථ සහ පරහිතකාමී පැතුම් සාක්ෂාත් කර ගැනීම සඳහා අනෙකුත් නිල සහ නිල නොවන පථ හා නිශ්චිත මෙන්ම පැහැදිලි ලෙස සම්බන්ධ වුණු උපාය මාර්ගවල දැඩි අවශ්‍යතාවක් පවතී. අර්බුකාරී කලාපවල ප්‍රචණ්ඩ ගැටුම් හා කටයුතු කිරීමට මෙන්ම, සාධාරණ සහ චිරස්ථායී සාමකාමී සම්බන්ධතාවන් ප්‍රවර්ධනය කිරීම උදෙසා ප්‍රබල මාර්ග සොයන්නන්ට අභියෝග වන්නේ සිය විශ්ලේෂණයන් බෙදාහැරීමට සහ අදාළ සියලු ක්‍රියාකාරීන්ට මේවා සන්නිවේදනය කිරීම සඳහා සියලුම සාමය ගොඩනංවන ක්‍රියාකාරීන් අතර, ඉහළ මට්ටමක උත්ප්‍රේරක මාර්ග සොයාගැනීම වේ.

වඩා විශ්ලේෂණීය සහ ප්‍රබල ලෙස සාමය ගොඩනැංවීමේ ක්‍රියාවලියක් සඳහා සංවර්ධන සහ ගැටුම් ව්‍යාවර්තනීය ප්‍රජාව අතර, රැඩිකල් සහ තීරණාත්මක සාකච්ඡාමය ක්‍රියාවලියක් අත්‍යවශ්‍ය

වේ. කිසිවෙකුට තනිවම ක්‍රියාත්මක වී ස්ථාවර සහ පවත්නා සාමයක් ලබාදීමට වත් කිසිවෙකුට වගකීම් වෙනත් අයෙකු මත පැටවීමෙන්වත් ඔවුන් අතර අසමානතා දුරලීමට නොහැකි ය. වෙනත් ආකාරයකින් පැවසුවහොත්, එය හුදෙක් ගැටුම් ව්‍යාවර්තන කාර්ය සංවර්ධන හෝ යුක්තිය පසිඳලීමේ පරිමාණය අනුයෝජනය කිරීම හෝ සංවර්ධන සහ යුක්තිය පසිඳලීමේ කාර්යයට ගැටුම් ව්‍යාවර්තනය කිරීම නොවේ. අනුයෝජනය ඉන් ඔබ්බට ගියහොත් සංවර්ධන ගැටුම් ව්‍යාවර්තන න්‍යායාචාරීන් සංසන්දනාත්මක විශ්ලේෂණ සහ ක්‍රියාවලීන් විස්තීරණය කිරීමට න්‍යායාත්මකව සහ ප්‍රායෝගිකව දායක වන්නා වූ දෘෂ්ටිකෝණ සහ පථයන්හි වැදගත්කම හඳුනා ගැනීම සඳහා අන්‍යයන් සමඟ සාකච්ඡා කළ යුතුය. මින් වඩා අවබෝධයක් සහිතව සහ ඥාණාන්විතව සමාජ සහ දේශපාලනික වෙනස්කම්, ව්‍යුහාත්මක ස්ථාවරත්වය සහ ස්ථාවර සාමයක් උදෙසා ක්‍රියා කරන තනි පුද්ගලයන්, සංවිධාන සහ ව්‍යාපාරවලට ආධාර ලබාදීම සඳහා දායකත්වය සපයයි.

ගැටුම් ව්‍යාවර්තනකයෝ සහ සංවර්ධන විශේෂඥයෝ අභියෝගාත්මක ව්‍යුහමය ප්‍රචණ්ඩත්වය සහ අයුක්තිය ඉලක්ක කොටගත් ක්‍රියාවලීන් සඳහා සහාය වන අතරතුර ප්‍රචණ්ඩ සබඳතා ව්‍යාවර්තනය කිරීමට උත්සාහ කිරීමේ බැරෑරුම් කාර්යයකට යොමු වී සිටිති. අභියෝගය වනුයේ වැසියන් සහ සමාජය බලාත්මක කිරීමේ මාර්ග සහ සමාජය බලාත්මක කිරීමේ මාර්ග සහ උපක්‍රමයන් සොයාගැනීම වන අතර, ඉන් ඔවුනට ප්‍රචණ්ඩ සම්බන්ධතාවන් ව්‍යාවර්තනය කරගත හැකිය. ඒ සමගම ආර්ථික දේශපාලනික සහ සමාජයීය ආයතන සංවර්ධනය වී ඇති විට (නැතහොත් ඔවුන්ගේ කාර්ය ඉටු කිරීමේ ලා පැහැදිලිවම නොහැකියාවක් පවතින අවස්ථාවක ඒවා වෙනස් කළ විට), අනාගතයේ ප්‍රචණ්ඩත්වය අවම කිරීම සහතික කිරීම අවශ්‍ය වේ.



මෙය ප්‍රබලව සිදු කිරීම සඳහා ගැටුම් ව්‍යාවර්තක විශේෂඥයන් සහ සංවර්ධන විශේෂඥයන් අතර සෘණ ආර්ථික ක්‍රියාවලි හෝ අනුග්‍රාහකයන් මත පදනම් වූ දේශපාලනික ජාලයන් (සමහර කණ්ඩායම්වලට වාසිදායක සහ අන්‍යයන්ට අවාසිදායක) අභියෝගයන්ට ලක් කළ හැකි සහ වෙනස් කළ හැකි බුද්ධිමත් සාකච්ඡා අත්‍යවශ්‍ය වේ. මෙම විකෘති වූ ආර්ථික ක්‍රියාවලි මගින් අපේක්ෂාභංගත්වය වර්ධනය කරනසුලු අහිතකාරී සමාජ සහ දේශපාලන ප්‍රතිඵල ඇති කළ හැකිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බලයේ සිටින්නන් ඔවුන්ගේ වර්ධනය වන අස්ථාවර තත්ත්වය ප්‍රචණ්ඩත්වය මගින් සුළු බහුතර කණ්ඩායම්වලට විකල්පයක් ලෙස සැලකීමට බල කිරීමට පෙළඹේ. බොහෝ ගැටුම් ව්‍යාවර්තන ක්‍රියාකාරකම් ගැටලුවලට අවධානය යොදවන්නේ ඉතා අල්ප වශයෙනි.

එවන් සාකච්ඡාවලට පහසුකම් සැපයීම සඳහා සංවර්ධන සහ ගැටුම් නිරාකරණ විශේෂඥයන්ගේ ඉහළ මට්ටමක සහයෝගීතාවයක් අපේක්ෂා වෙයි. එවන් ගැටලු, ලෝක බැංකුවට හෝ ද්වි පාර්ශවික දානපතියන් සඳහා ඉතිරි කිරීම වෙනුවට, සිවිල් සමාජයේ අවදානම් දරන්නන් ඒවාට සම්බන්ධ කරවීම ද වැදගත් වේ. මන්ද, හීන වූ ජාතික සම්පත් ලැබිය යුත්තන් නිශ්චය කිරීමේ දී ඇතුළත් විය යුතු අය සහ ඉවත් කළ යුතු අය පිළිබඳව අවධානය යොමු කිරීම මීට ඉවහල් වන බැවිනි. ප්‍රචණ්ඩත්වය නතර කිරීමට පමණක් නොව සාධාරණ සහ තිරසාර සාමය ඇති කිරීමට උනන්දුවන්නන් මුහුණපාන ප්‍රධානතම අභියෝගය වනුයේ එවැනි ගැටලු පිළිබඳව සාකච්ඡා සහ සංවාද ඇති කළ හැකි පරිදි ඒවා න්‍යාය පත්‍රවල ඇතුළත් කළ හැක්කේ කෙසේ ද යන්නයි.

බිය අවම කිරීම, විශ්වාසය ගොඩනැංවීම සහ ආත්ම විශ්වාසය යළි ඇති කිරීම යනාදිය ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම උදෙසා තීරණාත්මක සංරචක වුවත් ඒවා පමණක් ප්‍රමාණවත් නොවේ. ඊට වෙනස් ආකාරයක දේශපාලනයක් මත ගොඩනැංවුණු, වඩා ආකර්ෂණීය ලෙස පථ II අනුව දේශපාලනීකරණය වූ ගැටුම් නිරාකරණ ක්‍රියාවලියක් අවශ්‍ය වේ. එය දේශපාලනයට අවම එදිරිවාදිකම් ඇති, ගැටලු නිරාකරණ සංස්ථානයක් ඉල්ලා සිටී. මා සිතන පරිදි ගැටුම් නිරාකරණ ප්‍රජාවට දූෂණයෙන් තොර රාජ්‍ය ක්‍රමයක් ගොඩනැංවීමේ ලා ලබාදිය හැකි ලොකුම දායකත්වය මෙය වේ. එය තරගකාරීත්වයක් වෙනුවට සහයෝගීතාව මත සියල්ලන්ගේම උනන්දුව දේශපාලනික ක්‍රියාවලියේ හදවත තුළ ස්ථානගත වූ, එදිරිවාදී වෙනුවට, කොන්දේසි විරහිතව ප්‍රයෝජනවත් ආදර්ශ දේශපාලනික ක්‍රියාවලියක් ඇති කිරීමෙන් ආරම්භ කළ හැකිය. මෙය මඳක් මනෝරාජ්‍යමය ලෙස දැකිය හැකි නමුත්, අත්‍යවශ්‍යයෙන් ම මහා පරිමාණ සංවර්ධන දානපතියන් බොහොමයක් ගමන් කරන දිශාව මෙයයි.

**කොටුව 2 : බුරුන්ඩිහි ජාත්‍යන්තර ඇලර්ට් වැඩසටහන: ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක්**

ජාත්‍යන්තර ඇලර්ට් ආයතනය ප්‍රචණ්ඩ ගැටුම් පවතින කොකේසස්, මහාවිල්, බටහිර අප්‍රිකාව, ශ්‍රී ලංකාව සහ කොලොම්බියා වැනි විවිධ කලාපවල වැඩසටහන් ගොඩනගා තිබේ. මෙම සෑම ස්ථානයක ම දේශීය ජනතාව විසින් තමන්ගේ ම ගැටුම්වලට පිළියම් යෙදීමට යොමු කිරීම සහ මෙම ගැටලුවලට ඔවුන්ගේ විසඳුම් ලබාදෙන විට ආධාර කළ හැකි පරිදි සිය භූමිකාව මූලික ලෙස දක්වා ඇත.

උදාහරණ වශයෙන් බුරුණ්ඩි යනු ජාත්‍යන්තර ඇලර්ට් ආයතනය පුළුල් ලෙස ක්‍රියාකාරී වන ප්‍රදේශයකි. හුටු සහ ටුට්සි ගෝත්‍රික නායකයින් අතර, මනෝ-භීති මට්ටම් අඩුකොට විශ්වාසය යළි ඇති කිරීමට සහ ගැටුම් අඩු කිරීමට සහාය වීමේ ලා සහාය වූ දේශපාලනික සහ හමුදා නායකයින් සමග සාකච්ඡා මාලාවක් එහි කාර්යය මණ්ඩලය විසින් ගොඩනගා ඇත. තවද, ඔවුන් විවිධ කාන්තා කණ්ඩායම් සහ කතෝලික පල්ලි සමග ආත්ම විශ්වාසය සහ විශ්වාස ගොඩනැංවීමේ වැඩසටහන් ද ඇති කර තිබේ. නීතිපති දෙපාර්තමේන්තුව සහ මානව හිමිකම් අමාත්‍යාංශය සමග ද කටයුතු කර ඇත. බුරුණ්ඩි හි අධිකරණ සහ අධ්‍යාපන පද්ධතිවල විශ්ලේෂකයන් වර්ගවාදී බෙදීම් හරහා ආයතනික සැකසීම් වෙනස් කොට සැලකූ අයුරු සහ ඒ මඟින් ජාතිවාදී ප්‍රශ්න සදාකාලික බවට පත් කළ අයුරු හුවා දක්වා ඇත. මෙම ක්‍රියාකාරකම් සියල්ල, දැඩිව විභේදනය වී ඇති ප්‍රජාව හරහා ඵලදායී සම්බන්ධතා ඇති කිරීමට ප්‍රයෝජනවත් විය හැකි සාධක ලෙසට ප්‍රබලව තහවුරු කර ඇත.

වර්ෂ 1955 සිට වර්ධනය වෙමින් පැවැති විශ්වාසවන්ත සබඳතා ද, වඩා සංවේදී දේශපාලනික ගැටලු සමහරක් පිළිබඳව තීරණාත්මක සහ වඩා හොඳ නිරීක්ෂණයන් යුතු ප්‍රශ්න හවුල්කරුවන්ගෙන් ඇසීමට කාර්ය මණ්ඩලයට ඉඩ ප්‍රස්තා

ලබාදෙන ලදී. යුද හමුදාව සහ එහි හට පිරිස් ඒකාබද්ධතාවය සහ එහි හුටු නියෝජනය මඳ බව පිළිබඳව මෙන්ම රැකියා, පාසල් සහ රාජ්‍ය බලය තුළින් ගලනය වන ඵල ප්‍රයෝජන සඳහා අසමාන ප්‍රවේශය වැනි ප්‍රශ්න රැසක් මතු කරන ලදී; කෙසේ නමුත්, අඩු වැඩි වශයෙන් සාකච්ඡා ක්‍රියාවලීන් නිශ්චය කිරීම සඳහා හෝ ප්‍රැට්‍රික් ගැෆ්නි (2000) හඳුන්වන පරිදි "වර්ගවාදය සහ නවීකරණය පිළිබඳ ආර්ථිකය සහ නවීන ආර්ථිකයෙන් සහ ලෝක වෙළෙඳපොළ ක්‍රමයෙන් බුරුන්ඩිහි විවිධ වාර්ගික කණ්ඩායම් හා සංයෝග/ බැහැර කළ විවිධ මාර්ග" අනුව එකී සන්දර්භය තුළ සිවිල් සමාජ සංවර්ධනය ගැන සාකච්ඡා යොමු වී නැත. මින් අදහස් වනුයේ, වර්ගවාදී විභේදනය හරහා සබඳතා යළි ගොඩනැංවීමට හා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට විශාල උත්සාහයක් ගත්ත ද ඊට යටින් දිවෙන ආර්ථික පරතරය හා විභේදන ප්‍රභවයන් ගැන කටයුතු කර ඇත්තේ වඩා වක් අන්දමින් බවයි.

විශේෂිත ගැටලු කිහිපයක් - උදාහරණ වශයෙන්, ශ්‍රම බලකාය, කෝපි මත රැඳුණු ආර්ථික යැපීම, ග්‍රාමීය/ නාගරික අංශ සඳහා අයවැය වෙන් කිරීම ආදිය මත ඉලක්ක වූ සාකච්ඡා වට කිහිපයක් පැවැත්විණි. නිදසුනක් ලෙස බුජුම්බරා හා ඒ අවට ප්‍රදේශ සමස්ත ජාතික ආයෝජනයෙන් සියයට පනහක් අවශෝෂණය කරගනී. මෙය දේශපාලනික සහ හමුදාමය ප්‍රභූන්ගේ භූමිය වූ බුරුරි සඳහා වෙන් කරන ලද සියයට 16 සමග එක් වූ විට ජනගහනයෙන් හතරෙන් තුනකට ඉතිරි වනුයේ ජාතික ආයෝජනවලින් තුනෙන් එකක් පමණි (එම). මෙම ගැටලුව, බුරුණ්ඩි සමාජයට ඇතුළත හා ඉන් පිටත සිටින්නන්ගේ සිතේ පවතින අතර, එහි සංවේදීතාවය නිසා ගැටුම් ව්‍යාවර්තන ක්‍රියාවලිය තුළ ප්‍රබල ආකාරයෙන් මෙම ගැටලුව සහ අනෙකුත් ගැටුම් මතු කරන්නේ කෙසේද යන්න පිළිබඳ නිරතුරුවම අවිනිශ්චිතභාවයක් පවතී. දේශපාලන ආර්ථිකයක් පිළිබඳ ව කෙරෙන සාකච්ඡා, හුටු/ ටුට්සි වාර්ගික විභේදන යා කිරීමට අවධානය යොමු කිරීම හෝ ජාතික අභිවෘද්ධිය සඳහා වූ සන්ධානය (Union for National Progress) හෝ බුරුන්ඩිහි ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා වූ පෙරමුණ (Front for Democarcy in Burundi) ආදී දේශපාලන කණ්ඩායම් අතර අවබෝධයක් හෝ එකඟතාවයක් ඇති කිරීමට වඩා වෙනස් ආකාරයක සාකච්ඡාවන් වේ. ස්ථිරවම ඒවා කැරලිකරුවන් සාම සාකච්ඡාවලට අනුයෝජනය කර ගැනීමේ මාර්ගයෙන් සාකච්ඡා කිරීමට වඩා බෙහෙවින් වෙනස් ය. මේ සියල්ලම සාමය සඳහා ගවේෂණයක් කරන නමුත් සාධාරණ සහ චිරස්ථායී සාමය වර්ධනය කිරීමේ අර්ථයෙන් ගත් කල මෙම ක්‍රියාවලීන්ගෙන් සමහරක් අවසානයේ අනෙක් ඒවාට වඩා බොහෝ විට තත්ත්වපරීක්ෂා වේ.



පථ I (Track I) හි ක්‍රියාකාරීහු (දේශපාලනඥයන්, රාජ්‍ය තාන්ත්‍රිකයින්, කලාපීය සහ විශ්ව ආයතනවල සහ බහු පාර්ශවීය මූල්‍යායතනවල නියෝජිතයින්) ප්‍රචණ්ඩ ගැටුමක් ඇති වූ අවස්ථාවක ඊට ප්‍රතිචාර දැක්වීමට වඩා, එය වැළැක්වීමට ඔවුන්ගේ සම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීම

පිළිබඳව වැඩි අවධානයක් යොමු කරති. ප්‍රතිපත්ති නිර්මාණකරුවන්ගේ කාර්ය භාරයේ දී, ප්‍රචණ්ඩත්ව ගැටුම් මත වෙනස් සංවර්ධන මැදිහත්වීම්වල ධන සහ ඍණ බලපෑම් සම්බන්ධයෙන් ගැඹුරු අවධානයක් යොමු වී ඇත. මෙය, වඩා සංගත ගැටුම් වැළැක්වීම හා සාමය ගොඩනැංවීම උපාය මාර්ග සහ ගැටුම් සංවේදී සංවර්ධනය සඳහා වූ ක්‍රමානුකූල උපාංග සඳහා වූ කැමැත්ත හා එකට බැඳී ඇත (Gaigals & Leonhardt 2001). ගැටුම් වැළැක්වීම සත්‍ය වශයෙන් ම දේශපාලන සහ සංවර්ධන න්‍යාය පත්‍රවල කේන්ද්‍ර-ස්ථාන වේ.

වර්ධනය කළ යුතුව ඇත්තේ දේශපාලන කැපවීම් සහ ගැටුම් සංවේදී සංවර්ධන ක්‍රමෝපායයන්ට ප්‍රමුඛත්වය ලබාදීම සහ ඊටත් වඩා වැදගත් වන සාර්ව-ප්‍රතිපත්ති සහ සූක්ෂ්ම-වැඩපිළිවෙලවල් හා ව්‍යාපෘති-චක්‍රීය ආකෘති වර්ධනය කිරීමයි. නිවැරදි වැඩසටහන්වල අවශ්‍යතා ස්ථාපනය කරන්නේ කුමක්ද සහ සෑම අංශයක ම ප්‍රචණ්ඩ ගැටුම්වල දී ප්‍රමුඛ ප්‍රතිචාරය දක්වන්නේ කුමක් ද යන්න පිළිබඳව විවිධ මට්ටම්වල සාකච්ඡා පැවැත්වෙන අතර සංවර්ධන ඒජන්සි ආයතන අතර මූලික කාර්යභාර අතර බර දැරීම බෙදා ගැනීම, වගකීම්, විශේෂිත භූමිකා සම්බන්ධයෙන් නිසැකයෙන් සාකච්ඡා කිරීම ඇතුළත් ය. මෙම සාකච්ඡා පැවැත්වීම සුබ ලකුණක් වන අතර සාමය, ස්ථාවරත්වය සහ මිනිස් ආරක්ෂාව ආදිය ප්‍රචණ්ඩ ගැටුම් කලාපවල ද්විපාර්ශ්වීය, කලාපීය සහ බහුපාර්ශ්වීය සංවර්ධන සැලසුම් මූල්‍යාධාරවල මධ්‍ය ලක්ෂ්‍යයේ විය යුතු බවට සාමාන්‍ය එකඟත්වයක් ඇත.

බොහෝ බහු පාර්ශ්වීය සංවර්ධන ක්‍රියාදාමයන් ඔවුන්ගේ සාකච්ඡාවල දී ආර්ථික ප්‍රශ්නවලට ප්‍රමුඛත්වය ලබාදෙන අතර සිවිල් සමාජයීය ගැටුම් නිරාකරණ ආරම්භයන්වල දී සාමාන්‍යයෙන් මෙම ගැටලු මග හැරේ. පථ I හි ක්‍රියාකාරීන්ට ඉතිරිවන වඩා සංකීර්ණ ගැටලුව නම් (පථ II හි සහ පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීන්ට මෙන්) වඩා අසීරු දේශපාලනික ප්‍රශ්න මතු කිරීමේ සුදුසු මාර්ග සහ ක්‍රම සෙවීම යි.

අනෙකුත් රාජ්‍යවල අභ්‍යන්තර ප්‍රශ්නවල දී මැදිහත් නොවී සිටීමේ ප්‍රතිපත්තිය යනුවෙන් අදහස් කරන්නේ නිල මට්ටමේ සාකච්ඡා කරන්නන් හට යථා පරිදි හෝ උරුම වශයෙන් බලය ඇති ඇතැම් රාජ්‍ය පාර්ශවයන්ට ඔවුන් පාලනය කරන දේශසීමාව සම්බන්ධයෙන් ප්‍රබල බලයක් භාවිත කළ හැකි ද යන්න වැනි බොහෝ කරුණු නොසලකා හැරීමට සිදුවීමයි. ඔවුන් මිනිස් ආරක්ෂාව සඳහා රාජ්‍ය අභියෝග, දූෂණය සහ අජීවී හෝ දුබල ආණ්ඩු ක්‍රමය මැඩ පැවැත්වීමට කටයුතු කළ යුතුය. ඔවුන්ට, රාජ්‍යතාන්ත්‍රික නියෝජනය මගින් ජාතික මට්ටමේ බුද්ධිමත් ජනතාව ගැටුම් ප්‍රවර්ධනය කරයි ද නැතහොත් එය පවත්වා ගෙන යාමට අදහස් කරයි ද යන්න විචක්ෂණශීලීව තහවුරු කළ හැකි අතර, ඒ අනුව සුදුසු ප්‍රතිචාර ගොඩනැගිය හැකිය. ඔවුනට දේශපාලන කටයුතු පිළිබඳව එක්සත් ජාතීන්ගේ දෙපාර්තමේන්තු හා සම්බන්ධ විය හැකි අතර, මානුෂික ප්‍රශ්න පිළිබඳව හා මානුෂික ආධාර පිළිබඳව සම්බන්ධීකරණ කාර්යාලය හා සම්බන්ධ විය හැකිය. ඔවුන්ගේ තත්ත්වය ඉතා බරපතළ වේ නම් දූෂණය සහ නීති විරෝධී වෙළෙඳ ගැටලු සම්බන්ධයෙන් ලෝක බැංකුවේ නව කොන්දේසි පිළිබඳව අවධානය යොමු කිරීමට ඉල්ලා සිටිනු ඇත. මෙම ක්‍රමෝපායේ තිබෙන ගැටලුව නම් ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තිරස් හා සිරස් සාධාරණත්වය වඩා කාර්යක්ෂමතාව පිළිබඳව උනන්දුවක් දැක්වීමයි. නාෆ්සිගර් (2000) තර්ක කරන පරිදි බොහෝ යුද කලාපවල ප්‍රචණ්ඩ ගැටුම්වලට ප්‍රධාන හේතු වන්නේ මේවා නම් මේවා න්‍යාය පත්‍රයට දැමීම අනෙකුත් ක්‍රියාකාරීන්ට අයත් කාර්යයක් වේ.

ජාත්‍යන්තර දේශපාලනයේ යථාර්ථයන්, රාජ්‍ය ක්‍රියාකාරීන්ට මෙම ප්‍රදේශයන්හි ද ද්විපාර්ශව ලෙස සාකච්ඡා ආරම්භ කිරීම අසීරු කර තිබෙන අතර, කැමැත්ත දක්වන රටවල් අතර පුළුල් සහාගයක් ඇති කිරීමේ ආවස්ථික පිරිවැය සහ ඉන් පසුව සාමූහික දේශපාලනික අභිමතය ස්ථාවර කිරීම නිරන්තරයෙන් ඉතා ඉහළ ය. මෙහි ද අදහස වනුයේ ඇසිය යුතු ප්‍රශ්න නොඅසා තිබීම, සහ ගත යුතු ක්‍රියාමාර්ග නොගෙන තිබීමයි. මෙය අනිවාර්යයෙන් ම ආසන්න ගැටුමක පළමු සංඥාව වේ. අන්තර් ජාතික ප්‍රජාව හෝ තවමත් ගැටුමක උග්‍ර අර්බුදයකට සාර්ථකව ප්‍රතිචාර දක්වීමේ මගක් සොයාගෙන නැත. එය, නිරීක්ෂණය කිරීමේ ලා සාර්ථක වුව ද ප්‍රතික්‍රියා දක්වීමේ ලා එතරම් සාර්ථක නැත. එය, සුළු වශයෙන් පශ්චාත් - ගැටුම් අංශ ස්ථාවර කිරීමට විශේෂයෙන් සාම සාධනය, සිවිල් වැසියන් ආරක්ෂා කිරීම, ස්වාධීන අධිකරණ පද්ධතියක් ගොඩනැංවීම, නිරායුධකරණය සහ විසුරුවා හැරීමේ ක්‍රමෝපායන්වල දී සාර්ථකය. කෙසේ වෙතත්, මෙහිදී ද විවිධ දේශපාලන සංවිධානවලින් යමක් කවුරු ලබත් ද? මොනවා ලබත් ද? කවදා ලබත් ද? සහ කෙසේ ලබත් ද? යන අසීරු ප්‍රශ්න නිරතුරුව ම ස්වදේශිකයන්ට තීරණය කිරීමට ශේෂ වෙයි.

මෙය පෞද්ගලික අංශයට වැදගත් දායකත්වයක් ලබා දීමට හැකි ක්ෂේත්‍රයකි. මන්ද, අඩු වැඩි වශයෙන් ව්‍යාපාර, අස්ථාවර කලාපයකට වඩා ස්ථාවර කලාපයක ද, දූෂිත පරිසරයකට වඩා දූෂිත නොවූ පරිසරයක සහ ලොල් බවට කැප වූ අකාර්යක්ෂම රාජ්‍ය පද්ධතියකට වඩා මහජන සුබ සාධනය කැපවූ කාර්යක්ෂම රාජ්‍ය පද්ධතියක ද ක්‍රියාත්මකවීමට වඩා කැමැත්තක් දක්වන නිසාය. සත්‍ය වශයෙන් ම ආණ්ඩුවලින් අසීරු දේශපාලන ප්‍රශ්න න්‍යාය පත්‍රයකට දැමීමට හැකියාවක් නොමැති නම් පෞද්ගලික අංශය, දේශීය සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීන් සඳහා මෙම ප්‍රශ්න, ප්‍රජා සහ සිවිල් ස්ථරවල දී මතු කිරීමට උත්සාහ කිරීමට මෙම පථ I හි සහාය අවශ්‍ය වේ. යුද්ධයෙන් විනාශ වූ සමාජවල නිදහස් සහ දිරිමත් රාජ්‍ය නොවන සංවිධාන සඳහා දායකත්වය සහ රාජ්‍ය අනුග්‍රහය ලබා දීම පරම නිකැළැල් රාජ්‍යයක පටු අර්ථකථනයන් මඟ හැරීමට වැදගත් මාර්ගයක් වේ.



යුද්ධයෙන් විනාශ වූ මෙම සමාජයන් හි ඇති ප්‍රධාන ගැටලුව නම් වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම අකාර්යක්ෂම හෝ දුර්වල රාජ්‍යයන්ට බාහිර මැදිහත්කරුවන්ගේ අනුමත කළ නොහැකි ක්‍රියාවන්ට ප්‍රතිචාර දැක්වීමට ප්‍රබල දේශපාලන නායකයින් හෝ ප්‍රබල සිවිල් සමාජ වැසියන් හෝ නොමැතිවීම යි. එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා එවැනි සමාජයකට ජීවත්විය හැකි පරිසරයකට ආපසු යාම සඳහා පහසුකම් සැලසීමට හෝ එවැනි සමාජයක් පිළිබඳව 'භාරකාරත්වය' ගැනීමට අන්තර්ජාතික ප්‍රජාවට, නොහැකි අතර එසේ කිරීමට අවශ්‍යතාවක් ද නැත. තවද එවන් පරිසරවල සිටින දේශපාලන සහ ප්‍රජා නායකයෝ, ස්වාර්ථයෙහි නියැළී ගැටුම් ක්‍රියාවිරහිත තත්ත්වයට පත් කිරීමට උනන්දු වන අතර හැකිතාක් ආර්ථික සහ සමාජීය ඵල ප්‍රයෝජන, ස්වභාවික සහ දේශපාලන සම්පත් මගින් උකහා ගනිති. මින් අදහස් වන්නේ ගැටුම් ව්‍යාවර්තනයට ප්‍රබල, ප්‍රජාතන්ත්‍රවාදී සහ නිර්මල ආණ්ඩු ක්‍රමයක් සහ එවැනි ක්‍රියාවලියන් පෝෂණය කිරීමට අවශ්‍ය ආර්ථික ක්‍රියාවලියක් පිළිබඳ සාකච්ඡා පැවැත්වීමට හැකි ක්‍රම පිළිබඳව තවදුරටත් අවබෝධයක් ලබාගැනීම අවශ්‍ය බවයි. ගැටුම් ව්‍යාවර්තනයට සහ සාධාරණ සාමයට ප්‍රමුඛ අවශ්‍යතාව මෙයයි. මෙම ගැටලුවට පිළියම් නොයෙදුවහොත් ස්ථාවර හා සාධාරණ සාමය සඳහා අපේක්ෂාවන් ඉතා දුරස්ථ වන අතර, මේ සියල්ලෙන් ම අදහස් වනුයේ සියලු ප්‍රධාන කණ්ඩායම්වල දේශපාලනික සහ ආර්ථික අංශ ඇතුළුව සමාන්තර අසමානතා අවම වීමයි. නාසිගර් තර්ක කරනුයේ (2000, වෙළුම 2-20):

*තියුණු සමාන්තර අසමානතාවයක් ප්‍රදර්ශනය කෙරෙන සියලු රටවල්, සියලු අඩු ආදායම් ලබන රටවල්, සෘණ ආර්ථික වර්ධනයක් ඇති සියලු රටවල් සහ පසුගිය වසර විසි පහ තුළ අඛණ්ඩව අර්බුද පැවැති රටවල් ඇතුළු ගැටුම් ඇතිවීමේ ප්‍රවණතාවක් ඇති රටවල්වලට "නිවාරණ ප්‍රතිපත්ති, අදාළ කිරීම සිදු කළ යුතුය. තවද භින්න වූ රාජ්‍යයන් සහ නීත්‍යානුකූල ආකාරයට සමාජය පාලනය කළ නොහැකි රාජ්‍යයන්ට ද නිවාරණ ක්‍රියාමාර්ග අවශ්‍ය වේ."*

මෙසේ හෙයින් අනාගත න්‍යාය පත්‍රය ඉතා පැහැදිලි ය. සියලු ගැටුම් නිරාකරණ ක්‍රියාකාරීන්ට, ගැටුම්වල දේශපාලන ආර්ථිකයට වඩා සංවේදී වීමේ අවශ්‍යතාවක් පවතින අතර, සංවර්ධන ක්ෂේත්‍රයේ දී සංවර්ධනයේ 'ගැටුම්-සංවේදී' ස්වභාවය පිළිබඳ දැනුවත්වීමේ දැඩි අවශ්‍යතාවක් ඇත. මෙය යුද්ධයෙන් විනාශ වූ සමාජවල දායකයන් සහ ප්‍රතිග්‍රාහකයන් අතර, සැබවින්ම බලාත්මක වූ සහ නිදහස් හවුල්කාරීත්වයක් නිර්මාණය කිරීමේ දී පැරණි ගැටලු සහ අලුත් ක්‍රියාවලිය පිළිබඳ නව දෘෂ්ටිකෝණයක් සහ නව චින්තන රටාවල අවශ්‍යතාවක් මතු කරයි. සංවර්ධන සහ ගැටුම් නිරාකරණ ප්‍රජාවන් දෙක ම මෙම අවශ්‍යතාව තේරුම් ගැනීම සුභවාදී ලක්ෂණයකි. නුදුරු අනාගතයේදී යුද්ධයෙන් විනාශ වූ සමාජවල විවිධ මැදිහත්කරණ ක්‍රියාවලීන්හි දී ඒ දෙකෙහි න්‍යායාත්මක දෘෂ්ටිකෝණවල ඒකාබද්ධතාවක් ඇති වනු ඇත.

## 4. උගත් පාඩම්



ජාත්‍යන්තර ඇලර්ට් සංවිධානය සහ අනෙකුත් සංවිධාන උගෙන ඇති මෙම නව දෘෂ්ටි-කෝණයන් සම්බන්ධ පාඩම් සමහරක් මෙසේ දැක් වේ.

- පළමුව *සෑම ගැටුමක ම සුවිශේෂීභාවය සහ සාපේක්ෂ අද්විතීයත්වය තහවුරු කර ගැනීම වැදගත් වේ.* සමහර අවස්ථාවල, විශේෂයෙන් ගැටුම් ඇතිවීමට හේතු ගත් කල විශ්ව සාධාරණ අවස්ථා පවතී. උදාහරණ වශයෙන් තිරස් අසමානතාවය සහ කොල්ලකාරී රාජ්‍ය ගත හැකිය. නමුත් මේවා නිරාකරණය සම්බන්ධයෙන් විශේෂිත අවස්ථා තරම් වැදගත් නොවේ. මින් අදහස් වනුයේ ගැටුම් නිරාකරණ විශේෂඥයන්ට කළ හැකි වඩාත් ම වැදගත් කාර්යය නම් ගැටුමේ හේතු, ගැටුම් පාර්ශව සහ එය නිරාකරණයට ඇති බාධා සඳහා ප්‍රමාණවත් විශ්ලේෂණයට වඩා වැඩි යමක් සපයා දීමයි. ඔවුන් ගැටුම පිළිබඳ ලබාදිය හැකි හොඳම විශ්ලේෂණය, හැකි බොහෝ දෘෂ්ටිකෝණවලින් එනම්, ඇතුළත, පිටත, පහළ, මැද සහ ඉහළ සිට සහ සමාජ ආර්ථික මෙන්ම, දේශපාලනික දෘෂ්ටිකෝණයන්ගෙන් නිරීක්ෂණය කොට ලබාදිය යුතු වේ. මින් අදහස් වනුයේ අපගේ විශ්ලේෂණයේ රැඩිකල් සංදර්භකරණයකි. මෙය නොමැතිව ඊළඟ පියවර සාපේක්ෂ වශයෙන් දෝෂ සහගත වීමට ඉඩ තිබේ. අන්තර් ජාතික ඇලර්ට් හි එඩ් ගාර්ෂියා 'සංදර්භයෙන් තොර වදන් පෙළ රැවටිල්ලකි' (text without context is pretext) බව පැවසීමට කැමැත්තක් දක්වන්නේ ප්‍රධාන රාමුවක් හෝ මෙහෙයුම් නීති සංග්‍රහයක් අවශ්‍ය කරන ගැටුම් සන්දර්භගත කිරීමට ය. එවිට ගැටුම තුළ සිටින පාර්ශවයන්, ගැටුම් නිරාකරණ සේවකයන් එන්නේ කොහි සිට ද සහ ඔවුන්ගේ සිතුවිලි අවංක ද යන්න දනී. මෙහි තවත් අදහසක් වනුයේ මැදිහත්කරුවන් පළමුව, දෙවනුව හා තෙවනුව මනා පුහුණුවන්නන් විය යුතු බවයි. එවිට ඔවුන්ගේ පුහුණුවීම සහ සවන්දීම තුළ දී ඔවුන්ට, සතුරු පාර්ශවයන් තුළ ගැටලු තේරුම් ගැනීමට

සහාය නොදීමේ ආකල්ප වෙනස් කිරීම සහ නිශේධනාත්මක හැසිරීම් සහ ව්‍යූහයන් නවීකරණය කිරීම ආදියට සහාය විය හැකිය.

- දෙවනුව ගැටුම් සම්බන්ධයෙන් *බහු ශික්ෂණාත්මක සහ බහුකෝණීය විශ්ලේෂණයක් ලබාගැනීම ඉතා වැදගත් වේ.* රාජ්‍ය පද්ධතියට එරෙහිව සිවිල් සමාජ සංවිධානවලට පක්ෂග්‍රාහී වීම විලාසිතාවක් වුවත් යථාර්ථය නම් රාජ්‍ය පද්ධතීන් සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියට උපරිම වශයෙන් අත්‍යවශ්‍ය වන අතර, ඔවුන්ගේ අයිතිවාසිකම් සහ එක් වී විශ්ලේෂණය කළ යුතු වේ. රාජ්‍ය පද්ධතියට තනිවම සාමය ළඟා කළ නො හැකිය; සිවිල් සමාජ සංවිධානවලට ද තනිවම සාමය ළඟා කළ නො හැකිය. මෙම ආන්දෝලනාත්මක නොදැමුණු ගැටුම් නිරාකරණයට මෙකී උභයාංශයෙහි ම දායකත්වය ලබාදීම තහවුරු කළ යුතුය.

- තෙවනුව *විවිධ දේශපාලනික සංකීර්ණතා තුළ සහ ඒවා අතර සහසම්බන්ධතා අවබෝධ කටයුතුය.* මෙහිලා රාජ්‍යය, සිවිල් සමාජය, විධිමත් සහ නොවිධිමත් ආර්ථික අංශ, සාපරාධී සහ නිරපරාධී කණ්ඩායම්, පොලිස් සහ හමුදාමය මූලිකාංග සහ අනියම් හමුදා අතර සම්බන්ධතාවල ජාලගත ස්වභාවය අවබෝධ කර ගැනීම වැදගත් වේ. නියත වශයෙන් ම, ක්‍රියාකාරකම්වල සූක්ෂ්ම සහ සාර්ව තල අතර සම්බන්ධතාවය සහ මේවා එකිනෙකට සම්බන්ධවන ආකාරය අවබෝධ කර ගැනීමට අවශ්‍ය වේ. උදාහරණ වශයෙන්, ක්‍රියාකාරකම්වල බිම් මට්ටමේ සූක්ෂ්ම තලයේ කුමක් සිදුවේදැයි යන්න ගැන කිසිදු සම්බන්ධයක් නොමැතිව සාර්ව තලයේ සැලසුම් කිරීමෙන් කිසිදු පලක් නැත.



- සිව්වනුව *යුද්ධය සහ ප්‍රචණ්ඩත්වයේ, දේශපාලන ආර්ථිකය පිළිබඳ වඩා යථාර්ථවාදී විශ්ලේෂණයක් ලබාගැනීම අතිශයින් වැදගත්* වේ. නියත වශයෙන් ම සටන්කාමීන්ගේ දිරිදීම් සහ පෙළඹවීම් පිළිබඳව සහ යුද්ධයෙන් පීඩා විඳි තැනැත්තන්ගේ ඔරොත්තු දීමේ යාන්ත්‍රණය පිළිබඳව අවබෝධයක් ලබාගැනීම වැදගත් වේ. අපට 'මේ කුමක්ද' යන්න සහ යුද්ධයෙන් ජය ලබන්නන් සහ පරාජය ලබන්නේ කවුරුන්ද යන්න පිළිබඳ අවබෝධයක් නොමැතිනම් දේශපාලන එකඟත්වයක් ලබාගත්ත ද කිසිදාක දිගුකාලීන සහ ස්ථාවර සාමයක් ලබාගත නොහැකිය.

  විශේෂයෙන් ආර්ථික දිරිමත් කිරීම් ස්ථාවර ලෙස ප්‍රවාහය වනු වෙනුවට වඩා අස්ථාවර ලෙස ප්‍රවාහය වේ නම් කිසිසේත් එවන් සාමයක් කිසිදා ලබාගත නො හැකිය. නිදසුනක් ලෙස සියරා ලියෝන්හි ඩොලර් ප්‍රකෝටි ගණනක දියමන්ති වෙළෙඳාමට ප්‍රවේශය ප්‍රතිඵලය වූ සටන්කාමී විමුක්ති පෙරමුණට සහාය දැක්වීම අතහැර දැමීමට චාර්ල්ස් ටේලර් පෙළඹූ හේතුව කුමක්ද? ජනාධිපති ටේලර්ගේ දේශපාලන සහ හමුදා චර්යාවන් ප්‍රමාණවත් ලෙස නවීකරණය කිරීමට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය ලිබියාවට එරෙහිව පැන වූ සම්බාධක කෙතරම් දුරට සමත්වී ද?

- පස්වනුව, ගැටුම් ස්ථිතිකවලට වඩා ගතික මත නාභිගතවීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. ගැටුම් ගවේෂණය කළ යුත්තේ කාලය, විධික්‍රම, ප්‍රවණතා සහ වෙනස්වන සහාගයන් සමග වේ. ඇතැමෙකු අර්බුදය තුළ නිමග්නවී සිටිය දී ඇතැමෙකු ඒ පිළිබඳව දැනුවත්ව සිටින්නේ මඳ වශයෙන් වීම නිසා, ගැටුමේ ගතිලක්ෂණ ගවේෂණය කිරීම පාර්ශවයන්ට මහත් උපකාරයක් වනු

ඇත. ඇතැම් විට දැමුණු හැසිරීම්, ගැටුමට කෙසේ යහපත් වෙනසක් ඇති කරයි ද යන්න මොනවට පෙන්වා දේ.

- සයවනුව, ගැටුමට ප්‍රතිචාර දැක්වීම සඳහා *විවිධ ක්‍රියාකාරීන්ගේ භූමිකා සහ වගකීම් සහතික කිරීම වැදගත් වේ.* ක්ෂේත්‍රයේ ශ්‍රම විභේදනයේ පැහැදිලි වෙනසක් සිදුවනතාක් යහපත් අත්දැකීම් ලද නො හැකිය. 'කුමක්ද' සහ 'කෙසේද' යන්න පිළිබඳ විශේෂඥ දැනුමක් ලබාගන්නන් කාර්යයට සංයුක්ත වේ. අවම වශයෙන් ඉහළ මට්ටම්වල ඌනපූරණ සහතික වන අතර, උපරිම තලයේ දී විවිධ ක්‍රියාකාරකම් අපට වඩා විශේෂඥ දැනුමින් යුත් අනෙකුත් කණ්ඩායම්වලට මාරු කිරීම ඉතා වැදගත් වේ. ක්ෂේත්‍රය තුළ දී ඉහළ මට්ටමේ සම්බන්ධීකරණයක් ලබාගැනීම අපහසු හෙයින් අඩුම වශයෙන් තරගකාරීත්වය වැළැක්වීමට සහ එම කාර්යයන්හි නිරතවීම සඳහා පෙළඹවීමක් ඇති බවට තහවුරු කිරීමට අපට අවශ්‍ය වේ.

- සත්වනුව, *සාමය ගොඩනැංවීම සහ ගැටුම් නිරාකරණ ක්‍රියාදාමය, යුක්තිය සහ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකාංගවලින් විසන්ධි කිරීම නොකළ යුතුය.* සාමය ගොඩනැංවීම යනුවෙන් හැඳින්වෙන මධ්‍ය ඉලක්කයක් නොවූ බල කිරීමේ නියෝජිත ආයතනයක් නොමැතිව නිර්මාණය වූ විශේෂ ක්‍රියාකාරී අංශයක් නිර්මාණය වී ඇත්නම් සාමය ගොඩනැංවීම නිර්දේශපාලනීකරණය වන අතර එහි තියුණුභාවය නැති වේ. සාමය ගොඩනැංවීම පුස්සක් වේ. සිවිල් සමාජයට තනිවම සාමය ළඟා කළ නොහැකි නිසා සිවිල් සමාජය මත පදනම් වූ කාර්ය කෙරෙහි යම් ප්‍රමාණයක සැකයක් ඇතිවීම සාධාරණ ය. ඒ හා සමානව රාජ්‍ය දේශපාලන පද්ධතිවලට සහ බුද්ධිමත් ජනතාවට ද තනිවම සාමය ළඟා කළ නොහැකි හෙයින් ප්‍රචණ්ඩ ආකල්ප, හැසිරීම් සහ වාතාවරණ වෙනස් කිරීමේ ලා රාජ්‍ය පද්ධති සිවිල් සමාජයේ භූමිකා අගය කිරීම සහතික කිරීම ද අවශ්‍ය වේ.

- අටවනුව, ජාත්‍යන්තර ඇලර්ට් ආයතනය උගත් ඉතා වැදගත් පාඩම්වලින් එකක් නම් *බාහිර සංවිධාන අනෙකුත් මිනිසුන්ගේ ප්‍රශ්න නොවිසඳන බවයි.* ඔවුන් එය කිරීමට ඉදිරිපත් වුව ද ඔවුන් කරන්නේ ව්‍යාජයකි. බාහිර සංවිධානවලට කළ හැකි වන්නේ ගැටෙන ස්වදේශික පාර්ශවයන් ඔවුන්ගේ ගැටුමේ හේතුවට පිළියම් සොයන සහ ඔවුනොවුන් එය විසඳාගන්නා තත්ත්වය තුළ ආරක්ෂිත අවකාශයක් නැතහොත් යම් අවකාශයක් සපයා දීමයි. ගැටුම් ව්‍යාවර්තන කාර්යයේ ඉතා වැදගත් සිද්ධාන්තයන් වනුයේ ගැටෙන පාර්ශවයන් ම ඔවුන්ගේ ප්‍රශ්න විසඳගත යුතු බවයි. එම කණ්ඩායම්වලට අයත් බුද්ධිමත් ජනතාවට වත් තනිවම විසඳුම් ගෙන ආ නො හැකිය. ඔවුන් විසින් සාකච්ඡා මේසයට ළඟාවීමට පෙර කිසිදා සිදු නොකළ පරිදි පූර්ව උපදේශන සහ සාකච්ඡා පැවැත්වීම අපේක්ෂා කරන අතර, ඔවුන් ඔවුන්ගේ කොට්ඨාස නියෝජකත්වය රැගෙන ආ යුතුය. උදාහරණ වශයෙන් රිචඩ් හෝල්බෲක්, ඩේටෝන් හිදී බලාපොරොත්තු සුන්කරගත් අතර බොස්නියාවේ වාර්ගික සංහාරයට තිත තැබූ සාම ගිවිසුමට එළැඹුණු නමුත් බෝල්කන්ස් හි ගැටුමේ යටින් දිවෙන හේතුව නිරාකරණය කර නැත. තවදුරටත් සිවිල් සමාජ ස්තරයේ වෛරය පහ කර නැත. එය ප්‍රචණ්ඩත්වයේ යටින් දිවෙන හේතුවට පිළියම් යොදා නැති අතර වඩා වැදගත් වන්නේ අද දක්වා මතු පිටින් දක්නට ඇති ඓතිහාසික බේදවාචකයට පිළියම් යොදා නොමැති වීමයි.

- නවවැන්න, බාහිරින් පාර්ශ්වයන් (රාජ්‍ය නොවන සංවිධාන, අන්තර් ජාතික රාජ්‍ය සංවිධාන හෝ වෙන වෙනම වූ රාජ්‍ය) ගැටුමට දායක විය හැකි *සමානුපාතික බවේ අවශ්‍යතාවක්* පවතී. අවිහිංසාව, ගැටුම් නිවාරණය සහ ව්‍යාවර්තනය මත වැය කළ මුදල් ප්‍රමාණය අතිවිශාලය. සිදුවීම් වූ විවිධ ස්ථානවල දී ඇති සීමාසහිත සම්පත්වලින් කර ඇත්තේ කුමක් ද යන්න නිශ්චය කිරීම වැදගත් වේ. කෙසේ වෙතත්, 1970 සහ 1980 ගණන්වල දී සංවර්ධනය මෙන්ම සාමය ගොඩනැංවීම සහ ගැටුම් නිරාකරණය, සුභසාධන පරාධීනත්වය සඳහා නව වාහනයක් බවට පත් නොවීමට සහතික විය යුතුය.

- දස වනුව, තනි පුද්ගලයන් සහ සංවිධාන බලසම්පන්න සහ නිදහස් හවුල්කාරීත්වයක් ස්ථාපනය කළේ කෙසේද යන උභතෝකෝටිකයෙන් ප්‍රකාශ වූ දෑ සාරාංශ ගත කළ හැකිය. මෙය කිරීමට අමාරු කාර්යයක් වුවත් සාමය ගොඩනැංවීමේ ලා එය ඉතා වැදගත්ය. ප්‍රබල මැදිහත්කරුවෝ යනු කවරහුද? මැදිහත්කරුවන් තුළ විශ්වාසය ගොඩනැංවීම, සංස්කෘතියට සංවේදීවීම, වගකීම් දිරිමත් කිරීම සහ ස්වාධීනත්වය ප්‍රවර්ධනය කරන්නේ කෙසේද? එවන් මැදිහත්කරුවන් අතර ස්වදේශික හවුල්කරුවන්ට අසීරු ප්‍රශ්න ඇසීමට සහ ගැටලුකාරී ව්‍යූහයන් ව්‍යාවර්තනය කළ හැකි පරිදි ඔවුන් හා එක්ව කටයුතු කරන්නේ කෙසේ ද?

- එකොළොස්වනුව, අප කරන සියල්ල *ස්ථාවරත්වය* ඉලක්ක කරගෙන සිදු කිරීම අවදානම් සහිත වේ. අපගේ සියලු කාර්යයන් ක්‍රියාවලි කාර්යයන් වන අතර, මෙහි ඇත්තේ කාලය තුළින් වන බලපෑමක් පමණි. මින් අදහස් වනුයේ දිගු කාලයක සිට ඇදී ආ ගැටුමේ පාර්ශවයන් හා අප ගැටුමට පෙර, අතරතුර සහ පසුව බැඳී සිටිය යුතු බවයි. ප්‍රචණ්ඩත්වයේ තර්ජනයකින් තොරව අනාගතය පිළිබඳව අපේක්ෂා සහගතව සිතීමට අපට හැකිවන සේ සාකච්ඡා කළ ගිවිසුමක් හෝ අවබෝධයක් මිස ස්ථිර සාමයක් යනුවෙන් කිසිවක් නොමැත.

- දොළොස්වෙනි සහ අවසාන වශයෙන්, මෙම සියලු කාර්යයන් සමාජ සහ දේශපාලන වෙනස්වීමේ න්‍යායය මත රඳා පැවතිය යුතුය. අපේක්ෂා සහගත අනාගතයක් පිළිබඳ අපගේ දැක්ම කුමක් ද? මේවා එකිනෙක ඡේදනය වන්නේ කොතැන දී ද? අපට පිළිගැනීමට අසීරු නමුත් අන්‍යයන්ට ඉතා වැදගත් වන දෘෂ්ටීන් කෙරේ අප කෙතරම් සංවේදී ද? අන්‍යයන් පිළිබඳව යථාවබෝධ කරගැනීමට හැකිවන පරිදි සහ ඉන් අපට ගැඹුරු අර්ථ සොයාගැනීමට හැකිවන පරිදි අපගේ දෘෂ්ටිවලට අප ගමන් කරන්නට ඉඩ දෙන්නේ කෙසේද?



## 5. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම් සඳහා

Berdal, M. & D. M. Malone (eds.) 2000. *Greed and Governance: Economic Agendas in Civil Wars*, Boulder, CO: Lynne Rienner.

Collier, P. & A. Hoeffler 1998. "On Economic Causes of Civil War," *Oxford Economic Papers*, Vol. 50, 563-573.

Duffield, M. 1994. "The Political Economy of Internal War: Asset Transfer, Complex Emergencies and International Aid," *in* Macrae and Zwi, op. cit., 50-69.

Elwert, G. 1999. "Markets of Violence" *Sociologus: A Journal for Empirical Ethno-Sociology and Ethno-Psychology,* Supplement 1, Berlin: Duncker & Humblot, 85 – 102.

Fairhead, J. 2000, "The Conflict over Natural and Environmental Resources," *in* Nafziger et al., op. cit., Vol. 1, 147-178.

Gaffney, P. 2000. "Burundi," *in* Nafziger et al., op. cit., Vol. 2, 132-138.

Gaigals, C. and M. Leonhardt 2001. *Conflict Sensitive Approaches to Development,* London: Saferworld, International Alert and the International Development Research Centre.

Gould, S. 2001. *The Guardian,* 27th September.

Holsti, K. 1996. *The State, War and the State of War,* Cambridge: Cambridge University Press.

International Alert 2000. *The Business of Peace,* London: International Alert and Prince of Wales Business Leaders Forum.

Jackson, T., M. Page & D. Lilly 2001. *Conflict Trends and Dynamics to 2015*, Draft Paper, London: International Alert.

Macrae, J. and A. Zwi (eds.) 1994. *War and Hunger: Rethinking International Responses to Complex Emergencies,* London: Zed Books.

Miall, H., O. Ramsbotham & T. Woodhouse 2000. *Contemporary Conflict Resolution*, London: Polity Press.

Morrison, C. 2000. "Stabilization Programmes, Social Costs, Violence and Humanitarian Emergencies," *in* Nafziger et al., op. cit., Vol. 1, 207-239.

Nafziger, E W., F. Stewart and R. Väyrynen (eds.) 2000. *War, Hunger, and Displacement: The Origins of Humanitarian Emergencies,* Oxford University Press, Vols 1 and 2.

National Criminal Intelligence Service (NCIS) 2000. *2000 Annual Report*, London: Her Majesty‘s Stationary Office.

Uvin, P. 1998. *Aiding Violence. The Development Enterprise in Rwanda West,* Hartford, Conn: Kumarian Press.

Väyrynen, R. 2000. "Weak States and Humanitarian Emergencies: Failure, Predation and Rent-Seeking," *in* Nafziger et al., op. cit., Vol. 2, 437-480.

Woodward, S. 1995. *Balkan Tragedy: Chaos and Dissolution after the Cold War,* Washington, DC: Brookings Institution.